# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1981/2 - 2016 අගෝස්තු මස 22 වැනි සඳුදා - 2016.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමේ සමුපකාර නිලවරණ නියෝග මාලාව.**

ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශික කාරක සභා තෝරාපත්කර ගැනීම සඳහා නියෝග සකස් කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත බලය පවරා ඇති වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමේ කාර්ය පටිපාටි සහ ඊට සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු හෝ සම්බන්ධයෙන් සකස් කරන ලද සමුපකාර නිලවරණ නියෝග මාලාව වේ.

වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවල 23 වන අතුරු ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් නිශ්චිත අතුරු ව්‍යවස්ථාවකින් හෝ හා සී/ස උඩුබද්දාව විවිධ සේවා සමුපකාර සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 24 වන අතුරු ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතලවලට අනුව වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් දිසානායක මුදියන්සේලාගේ කුලමින චන්දන දිසානායක වන මම එසේ බලය පවරා ඇති වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා පහත සඳහන් නියෝග මෙයින් පනවමි.

ඩී.එම්.කේ.සී.දිසානායක,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (වයඹ).

2016 ක් වූ අගෝස්තු මස 12 වැනි දින
කුරුණෑගල දී ය.


1A - PG 3071 - 107 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* කොටස - සාමාන්‍ය

කෙටි නාමය හා නියෝග ක්‍රියාත්මක වන දිනය

1.1 මෙම නියෝගවලට වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමේ සමුපකාර නිලවරණ නියෝග මාලාව යනුවෙන් හඳුන්වන අතර, මෙම නිලවරණ නියෝග මාලාව ගැසට් පත්‍රයේ පල වූ දිනයේ සිට වයඹ පළාත සඳහා බලාත්මක විය යුතුයි.

නිලවරණ නියෝග අදාළ වීම

2.1 මෙහි මින්මතු නිලවරණ නියෝග මාලාව යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමේ සමුපකාර නිලවරණ නියෝග මාලාව අදාළ වන්නේ, තම ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීමේ නියෝග සකස් කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත බලය පවරා ඇති වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිති සඳහා පමණි.

2.2 වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරාපත්කර ගැනීම සඳහා නිලවරණ නියෝග මාලාවක් සකස් කිරීමට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට තත් කාලයේ වලංගු සමුපකාර නීතියකින් බලය ලැබී ඇති අවස්ථාවකදී, මෙම නිලවරණ නියෝග මාලාවේ කුමක් සඳහන් වී තිබුණත් ඒ පිළිබඳව නොසලකා මෙම නිලවරණ නියෝග මාලාව සකස් කරන ලද්දේ එම සමුපකාර නීතියෙන් ලැබුණු බලයකට අනුව බව තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුයි.

ඡන්ද කොට්ඨාසය, ඡන්ද ප්‍රදේශය හා ඡන්ද මධ්‍යස්ථානය

3.1 මෙම නිලවරණ නියෝග මාලාවේ කාර්යයන් සඳහා ඡන්ද කොට්ඨාසයක් ලෙස සැලකිය යුත්තේ අදාළ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන සමිතියට අයත් බල ප්‍රදේශය වේ.

3.2 නිලවරණ කටයුතු සඳහා ප්‍රාදේශික බල ප්‍රදේශ නිර්ණය කළ යුත්තේ පහත සඳහන් කර ඇති විධිවිධානවලට අනුකූලවයි.

(අ) මෙම නිලවරණ නියෝග මාලාවේ කාර්යයන් සඳහා ඡන්ද ප්‍රදේශයක් ලෙස සැලකිය යුත්තේ අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාදේශිකයක් සඳහා නියම කර ඇති එම ප්‍රාදේශිකයේ බල ප්‍රදේශය වේ.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යම් ප්‍රාදේශික බල ප්‍රදේශයක් යාබද ප්‍රාදේශිකයක බල ප්‍රදේශයකට ඒකාබද්ධ කර ඇති විටකදී හැර, යම් ප්‍රාදේශික බල ප්‍රදේශයක් තුළ ප්‍රාදේශිකයක් තිබුන ද, නොතිබුනද 3(2)(ඇ) හා 3(2)(ඈ) යන නිලවරණ නියෝගවල සඳහන් විධිවිධානවලට යටත්ව මෙම නිලවරණ නියෝග මාලාවේ කාර්යයන් සඳහා සැලකිය යුත්තේ 3(2)(අ) නිලවරණ නියෝගයෙහි සඳහන් කර ඇති ප්‍රාදේශික බල ප්‍රදේශ වේ.

(ඇ) එසේ වුව ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යම් ප්‍රාදේශික බල ප්‍රදේශයක් වෙනත් ප්‍රාදේශික බල ප්‍රදේශයකට ඒකාබද්ධ කිරීමට තීරණය කළ දිනයේ සිට මාස 06 ක් ඇතුළත ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා නාම යෝජනා බාර ගැනීමේ දිනය නිවේදනය කර ඇති විටක, ප්‍රාදේශික බල ප්‍රදේශ ඒකාබද්ධ කිරීම පිළිබඳව නොසලකා එසේ ඒකාබද්ධ කළ එක් එක් ප්‍රාදේශික බල ප්‍රදේශ සඳහා වෙන වෙනම ප්‍රාදේශික කාරක සභා ස්ථාපිත කිරීමට අවශ්‍ය විධිවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය යෙදිය යුතුයි.

(ඈ) 3(2)(ඇ) නිලවරණ නියෝගයේ සඳහන් කරුණුවලට යටත්ව ප්‍රාදේශික බල ප්‍රදේශ ඒකාබද්ධ කර ඇති අන් සෑම අවස්ථාවකදීම මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා සැලකිය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ කරන ලද ප්‍රාදේශික බල ප්‍රදේශ වේ.

3.3 මෙම නිලවරණ නියෝග මාලාවේ කාර්යයන් සඳහා ඡන්ද මධ්‍යස්ථානයක් පිහිටුවිය යුත්තේ ප්‍රාදේශික බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශික කාර්යාලයක හෝ ප්‍රාදේශිකයක හෝ මිනි කෝප් සිටියක හෝ කෝප් සිටියක හෝ වෙනත් ස්ථානයක හෝ වේ.

## *II කොටස - ඡන්දය හිමි සාමාජික නාම ලේඛන*

4.1 තත් කාලයේ වලංගු සමුපකාර නීතියට හා 8.1 (ඇ) නිලවරණ නියෝගයට අනුකූලව ඒ ඒ ප්‍රාදේශිකවල ඡන්දය දීමට සුදුසුකම් ඇති සියලුම සාමාජිකයින්ගේ නාම ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිටපත් 04 කින් යුතුව සෑම වර්ෂයකම ජුනි 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන එක් එක් හය මාසය සඳහා සකස් කළ යුතුයි. එම ඡන්දය හිමි සාමාජික නාම ලේඛන සකස් කළ යුත්තේ, ඒ එක් එක් හය මාසය අවසන් වී දින 10 ක් ඇතුළත පරිගණක යතුරු ලියනය කිරීමෙනි.

ඡන්දය හිමි සාමාජික නාම ලේඛන සකස් කිරීම

4.2 මින් අනතුරුව මෙම නිලවරණ නියෝග මාලාවේ ඡන්ද නාම ලේඛන යනුවෙන් හඳුන්වනු ලබන ඡන්දය හිමි සාමාජික නාම ලේඛන 4.1 නිලවරණ නියෝගයේ සඳහන් වන අන්දමට නියමිත කාලය තුළ නිවැරදිව සකස් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට, සාමාන්‍යාධිකාරීට හා ලේකම්ට පැවරෙන අතර,එම ඡන්ද නාම ලේඛන නිවැරදි බවට සහතික කොට සභාපතිවරයා, අධ්‍යක්ෂවරයෙකු, සාමාන්‍යාධිකාරී හා ලේකම් විසින් අත්සන් කර තිබිය යුතුයි.

5.1 4.1 නිලවරණ නියෝගයේ සඳහන් වන පරිදි ඡන්ද නාම ලේඛන සකස් කර අවසන් කළ මාසයේ 11 දින සිට 25 දින දක්වා කාලය තුළ ගාස්තු නොගෙවා ඕනෑම අයෙකුට පරීක්ෂා කිරීමට හැකිවන පරිදි ඡන්ද නාම ලේඛන පහත සඳහන් කර ඇති ස්ථානවල ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කළ යුතුයි.

ඡන්දය හිමි සාමාජික නාම ලේඛන ප්‍රදර්ශනය කිරීම

(අ) සමිතියේ ප්‍රධාන කාර්යාලය ;

*සහ*

(ආ) ප්‍රාදේශික කාර්යාලයේ හෝ ප්‍රාදේශිකයේ හෝ ප්‍රාදේශික කාර්යාලයක් / ප්‍රාදේශිකයක් නොමැති අවස්ථාවලදී එම ප්‍රාදේශික බල ප්‍රදේශය තුළ අදාළ සමිතියේම වෙනත් ව්‍යාපාරික ස්ථානයක් ඇති විට එම ස්ථානයේ හෝ එවැනි ව්‍යාපාරික ස්ථානයක් ද නොමැති විටක ප්‍රාදේශික බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාම නිලධාරී කාර්යාලයක හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන පොදු ස්ථානයක ;

*සහ*

(ඇ) 55.4නිලවරණ නියෝගයට යටත්ව සමිතියේ වෙබ් අඩවිය හෝ සමිතිය සතුව වෙබ් අඩවියක් නොමැති අවස්ථාවකදී වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා සුසංහිත තැටියක් (CD) හෝ අංකිත වීඩියෝ තැටියක් (DVD) හෝ සැනෙලි මතකයක් [Flash (Pen) drive] හෝ විද්‍යුත් තැපෑලක් (E-mail) හෝ මගින් ඡන්ද නාම ලේඛන වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දීම.

5.2 ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කරන දින හා ස්ථාන ද , 6.1 නිලවරණ නියෝගයට අනුව අභියාචනා හා 7.1 නිලවරණ නියෝගයට අනුව විරෝධතා ඉදිරිපත් කළ යුතු ආකාරය ද , ඇතුළත් දැන්වීමක් පුළුල් ප්‍රසිද්ධියක් ලැබෙන සේ පහත සඳහන් පරිදි ප්‍රදර්ශනය කිරීම හා පළ කිරීම කළ යුතුයි. ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කිරීමට නියමිත දිනයට දින 07 කටවත් කලින් මෙම දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හා පළ කිරීම සිදුකළ යුතුයි.

(අ). ඡන්ද ප්‍රදේශය ඇතුළත (ප්‍රාදේශික බල ප්‍රදේශය තුළ) ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම,

(ආ). සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා සමිතියේ අධීක්ෂණ කටයුතුභාර සහකාර සමුපකාර කොමසාරිස් කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම,

(ඇ). සිංහල භාෂාවෙන් ද, දෙමළ භාෂාවෙන් ද දිනපතා මුද්‍රණය වන ජාතික පුවත්පත් 02 ක දැන්වීම් පළ කිරීම.

6.1 4.1 හා 4.2 නිලවරණ නියෝගවලට අනුව සකස් කළ ඡන්ද නාම ලේඛනයට නමක් ඇතුල් වීමට සුදුසුකම් ඇති සාමාජිකයෙකුගේ නමක් ඇතුළත් වී නැති අවස්ථාවක, තම නම ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කර ගැනීම සඳහා 5.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කරන මාසයේ 11 දින සිට 25 දින දක්වා වූ කාලය තුළදී සමිතියේ ලේකම් මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පළමු අභියාචනයක් ඉදිරිපත් කිරීමට සාමාජිකයෙකුට අයිතියක් ඇත. ඒ අයුරින් ලැබෙන අභියාචනා

ඡන්දය හිමි සාමාජික නාම ලේඛනයකට නමක් ඇතුළත් කිරීම සඳහා අභියාචනා කිරීම.

පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලා යම් සාමාජිකයෙකුගේ නමක් ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කළ යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන්නේ නම්, ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ 10 වැනි දින හෝ ඊට පෙර හෝ එම නම ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කළ යුතුයි.

6.2 ඡන්ද නාම ලේඛනයට තම නම ඇතුළත් කරන ලෙසට සාමාජිකයෙකුගෙන් අභියාචනාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබුණු අවස්ථාවක, එම අභියාචනාව සමිතියට ලැබුණු දින සිට දින 14 ක් ඇතුළත අභියාචනාව ඉදිරිපත් කළ සාමාජිකයාට ඔහුගේ අභියාචනාවට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුයි.

6.3 සාමාජිකයෙකු ඉදිරිපත් කරන දෙවන අභියාචනාවක් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු යි.

(අ) ඡන්ද නාම ලේඛනයට තම නම ඇතුළත් කරන ලෙසට යම් සාමාජිකයෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට කරන ලද අභියාචනාවක් සඳහා ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ 15 දිනට පෙර සාමාජිකයාට පිළිතුරක් නොලැබුණු අවස්ථාවකදී හෝ තම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අභියාචනාව ඉදිරිපත් කළ සාමාජිකයාට පිළිතුරක් එවා තිබූ අවස්ථාවක දී හෝ තම නම ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කර ගැනීම සඳහා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත දෙවන අභියාචනයක් ඉදිරිපත් කිරීමට අගතියට පත් සාමාජිකයාට හැකියාවක් ඇත

(ආ) එවැනි අභියාචනයක් ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ 16 දින සිට එම මාසයේ 25 වන දිනය දක්වා කාලය තුළ සාමාජිකයා විසින් ඉදිරිපත් කළ යුතුයි. එසේ ලැබෙන අභියාචනා පිළිබඳව පරීක්ෂණයක් කර අභියාචනාව පිළිබඳ තම තීරණය අභියාචනාව ලැබුණු දිනයේ සිට දින 42 ක් ඇතුළත අභියාචනාව ඉදිරිපත් කළ සාමාජිකයාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දිය යුතු අතර, එම තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුයි.

(ඇ) සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවකට අනුව එම සාමාජිකයාගේ නම ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කළ යුතු බවට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්වූ දින සිට දින 10ක් ඇතුළත අදාළ සාමාජිකයාගේ නම, ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කළ යුතුයි.

ඡන්දය හිමි සාමාජික නාම ලේඛනයේ සඳහන් වී ඇති නමක් පිළිබඳව විරෝධතා ඉදිරිපත් කිරීම.

7.1 4.1 හා 4.2 නිලවරණ නියෝගවලට අනුව සකස් කළ ඡන්ද නාම ලේඛනයේ යම් අයෙකුගේ නමක් ඇතුළත් වී තිබීම සම්බන්ධයෙන් සමිතියේ ලේකම් මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව විරෝධතා ඉදිරිපත් කිරීමට ඕනෑම සාමාජිකයෙකුට අයිතියක් ඇත. එවැනි විරෝධතාවයක් සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ 5.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කරන මාසයේ 11 දින සිට 25 දින දක්වා වූ කාලය තුළදී විරෝධතාවය සඳහා ඉදිරිපත් කරන හේතු ද සමඟයි.

7.2 7.1 නිලවරණ නියෝගයට අනුව විරෝධතා ඉදිරිපත් කළ හැකි අවසාන දිනයේ සිට දින 10 ක් ඇතුළත ඒ අයුරින් ලැබුණු සියලුම විරෝධතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමෙන් අනතුරුව විරෝධතා එල්ල වූ අයෙකුගේ නමක් ඡන්ද නාම ලේඛනයෙන් ඉවත් කිරීමට තීරණය කළහොත්, එවැනි නමක් ඡන්ද නාම ලේඛනයෙන් ඉවත් කිරීමට ප්‍රථම පහත සඳහන් කර ඇති ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර තිබිය යුතුයි ;

(අ) ඉදිරිපත් වී ඇති විරෝධතා පිළිබඳවත්, එම විරෝධතාවලට විරුද්ධව ඉදිරිපත් කිරීමට ප්‍රතිවිරෝධතා ඇත්නම් එම ප්‍රතිවිරෝධතා ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවටත්, විරෝධතා එල්ල වී ඇති අයට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුයි. එය ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ 05 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විරෝධතා එල්ල වී ඇති අයට දැනුම් දිය යුතු අතර, ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කිරීම සඳහා වැඩ කරන දින 14 ක් වත් විරෝධතා එල්ල වී ඇති අයට ලබා දිය යුතුයි ;

(ආ) විරෝධතා එල්ල වී ඇති අය විසින් ප්‍රතිවිරෝධතා ඉදිරිපත් නොකිරීම නිසා හෝ ඉදිරිපත් කරන ලද ප්‍රතිවිරෝධතා පිළිබඳව සලකා බැලීමෙන් පසු හෝ විරෝධතා එල්ල වී ඇති අයගේ නම ඡන්ද නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළහොත්, ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ අවසාන දිනයට පෙර එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විරෝධතා එල්ල වී ඇති අයට හා විරෝධතාවය ඉදිරිපත් කළ සාමාජිකයාට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුයි.

7.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 7.1 නිලවරණ නියෝගයට අනුව ඉදිරිපත් කළ විරෝධතාවයක් ප්‍රතික්ෂේප කරන විට එම විරෝධතාවය ඉදිරිපත් කළ සාමාජිකයාට ද, 7.2 නිලවරණ නියෝගයට අනුව ඉදිරිපත් කළ ප්‍රතිවිරෝධතා පිළිගත් විට විරෝධතාවය ඉදිරිපත් කළ සාමාජිකයාට හා ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කළ සාමාජිකයාට ද ඒ බව ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුයි. එම දැනුම් දීම ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ අවසාන දිනයට පෙර සිදු කළ යුතුයි.

7.4 ඡන්ද නාමලේඛනයේ සඳහන් නමක් පිළිබඳව 7.1 නිලවරණ නියෝගයට අනුව විරෝධතා ඉදිරිපත් කළ සාමාජිකයෙකුට 7.3 නිලවරණ නියෝගයට අනුව විරෝධතාවය ප්‍රතික්ෂේප කර ඇති බව දන්වා එවා ඇති අවස්ථාවක හෝ ඉදිරිපත් කරන ලද විරෝධතාවය පිළිගත් බව/ප්‍රතික්ෂේප කළ බව සඳහන් පිළිතුරක් ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ අවසාන දිනය වන විටත් ලැබී නැති අවස්ථාවක හෝ තම විරෝධතාවය වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ හැක.

7.5 ඡන්ද නාම ලේඛනයේ සඳහන් වී ඇති තම නම ඉවත්කරන බවට 7.2 (ආ) නිලවරණ නියෝගයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා ඇති විට හෝ 7.2 (අ) නිලවරණ නියෝගයට අනුව ඉදිරිපත් කළ ප්‍රතිවිරෝධතා පිළිබඳව 7.2 (ආ) නිලවරණ නියෝගයේ සඳහන් කාලසීමාවක් තුළ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පිළිතුරක් ලැබී නැති විටක දී හෝ විරෝධතා එල්ල වී ඇති සාමාජිකයාට ඡන්ද නාම ලේඛනයේ සඳහන් වී ඇති තම නම ඉවත් කිරීමට විරුද්ධව අභියාචනාවක් වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ හැක.

7.6 7.4 හා 7.5 නිලවරණ නියෝගවල සඳහන් වන විරෝධතා හා අභියාචනා ඉදිරිපත් කරන සාමාජිකයින්, ඒවා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කළ මාසයට පසු එළඹෙන මාසයේ අවසාන දිනයේ සිට ඉදිරියට වූ දින 10 ක් ඇතුළතයි.

7.7 7.6 නිලවරණ නියෝගයෙහි සඳහන් පරිදි තමන් වෙත ලැබුණු විරෝධතා/අභියාචනා පිළිබඳව පරීක්ෂණයක් කර ඒ විරෝධතාවය/අභියාචනාව තමන්ට ලැබුණු දිනයේ සිට දින 42 ක් ඇතුළත ඒ පිළිබඳ තම තීරණය, අදාල විරෝධතාවය/අභියාචනාව ඉදිරිපත් කළ සාමාජිකයාට හා අධ්‍යක්ෂක මණ්ඩලයට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දිය යුතු අතර, වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ එම තීරණය අවසානාත්මක වේ.

7.8 7.5 නිලවරණ නියෝගයට අනුව සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවක් අනුව එම සාමාජිකයාගේ නම ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කළ යුතු බවට හෝ 7.4 නිලවරණ නියෝගයට අනුව සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවයකට අනුව යම් සාමාජිකයෙකුගේ නමක් ඡන්ද නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු බවට හෝ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා තීරණය කර ඇති විටක, එම තීරණය අධ්‍යක්ෂක මණ්ඩලයට දැන් වූ දින සිට දින 10 ක් ඇතුළත වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයට අනුකූලව ඡන්ද නාම ලේඛන සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුයි.

7.9 7.2 (ආ) නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන සංශෝධනය කිරීමට සිදුවන අවස්ථාවක එම ඡන්ද නාම ලේඛන සංශෝධනය කළ යුත්තේ, 7.8 නිලවරණ නියෝගයේ සඳහන් වන පරිදි ඡන්ද නාම ලේඛන සංශෝධනය කිරීමට නියම කර ඇති කාල සීමාව තුළයි.

**ඡන්ද නාම ලේඛන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම**

8.1 කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාගේ සහතිකය ලබා ගැනීම සඳහා ඡන්ද නාම ලේඛන ඔහුට ඉදිරිපත් කළ යුත්තේ පහත සඳහන් කර ඇති විධිවිධානවලට අනුකූලවයි;

(අ) 6.1 හා 6.3 (අ) යන නිලවරණ නියෝගවලට අනුව අභියාචනා හෝ 7.1 හා 7.4 යන නිලවරණ නියෝගවලට අනුව විරෝධතා හෝ ඉදිරිපත් වී නැති ප්‍රාදේශික සඳහා 4.2 නිලවරණ නියෝගයට අනුව සකස් කරන ලද ඡන්ද නාම ලේඛනවල පිටපත් 03 ක් සමිතිය භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරියා මගින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි;

(ආ) 6.1, 6.3 (ඇ), 7.2 (ආ), 7.8 හා 7.9 යන නිලවරණ නියෝගවලට අනුව ප්‍රාදේශිකවල සංශෝධනය කළ ඡන්ද නාම ලේඛන පිටපත් 04 කින් යුතුව සකස් කර, සභාපතිවරයා, අධ්‍යක්ෂකවරයෙකු, සාමාන්‍යාධිකාරී හා ලේකම් යන අය විසින් නිවැරදි බවට සහතික කර අත්සන් කරන ලද එම ඡන්ද නාම ලේඛනවලින් පිටපත් 03 ක් සමිතිය භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරියා මගින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි;

(ඇ) ඉහත (අ) හා (ආ) නියෝගවල සඳහන් ඡන්ද නාම ලේඛන කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ 4.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කර අවසාන වූ දිනයේ සිට මාස 04 ක් ඉක්ම යාමට පෙරයි. එසේ ඉදිරිපත් කරන ඡන්ද නාම ලේඛන පිටපත් 03 ක් සහතික කර ඉන් එක් පිටපතක් තමා වෙත රඳවාගෙන අනෙක් පිටපත් 02 ක කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආපසු යැවිය යුතුයි;

(ඈ) ඒ ඡන්ද නාම ලේඛන 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කරන චක්‍රලේඛනයක දක්වා ඇති "ඡන්ද නාම ලේඛනයේ ආකෘතියට" සාරානුකූල විය යුතුයි;

(ඉ) 8.1 (අ) හා 8.1 (ආ) යන නිලවරණ නියෝගවලට අනුව ඉදිරිපත් කළ යුතු ඡන්ද නාම ලේඛන සමග මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් විධිවිධානවලට අනුව ඡන්ද නාම ලේඛන සකස් කර ඇති බවට සභාපතිවරයා, අධ්‍යක්ෂවරයෙකු, සාමාන්‍යාධිකාරිවරයා හා ලේකම්වරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් ද කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත භාර දිය යුතුයි. ඒ සහතිකය මෙම නිලවරණ නියෝග මාලාවේ පළමු වන උපලේඛනයේ සඳහන් "සහතිකයට"සාරානුකූල විය යුතුයි.

**ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීම සඳහා භාවිතා කළ යුතු ඡන්ද නාම ලේඛන**

8.2 8.1 (ඇ) නිලවරණ නියෝගයට අනුව කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද ඡන්ද නාම ලේඛන අනුව හෝ / සහ 8.3 නිලවරණ නියෝගයට අනුව සකස් කරන ලද ඡන්ද නාම ලේඛන අනුව හෝ ඒ ඒ ප්‍රාදේශික සඳහා ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි.

**සමිතිය විසින් ඡන්ද නාම ලේඛන සකස් නොකරන විට කොමසාරිස්වරයා විසින් ගත යුතු ක්‍රියාමාර්ග**

8.3 මෙම නිලවරණ නියෝග මාලාවට අනුව ඡන්ද නාම ලේඛන සකස් කිරීමට හෝ සහතික කිරීමට හෝ ඡන්ද නාම ලේඛන සංශෝධනය කිරීමට හෝ වගකීම පැවරී ඇති සමිතියේ යම් තැනැත්තෙක්/තැනැත්තන් විසින් තම වගකීම් ඉටු නොකර පැහැර හැර ඇති බව සමිතිය භාරව සිටින සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරිවරයා හෝ වෙනත් නිලධාරියෙකු හෝ වාර්තා කර ඇති විට කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් පහත සඳහන් කර ඇති විධිවිධානයන්වලට අනුව කටයුතු කළ යුතුයි.

(අ) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 4.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන සකස් නොකරන විට හෝ 6.3 (ඇ) හා 7.8 යන නිලවරණ නියෝගවලට අනුව ඡන්ද නාම ලේඛන සංශෝධනය නොකරන විට හෝ 8.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද නාම ලේඛන සහතික නොකරන විට හෝ කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත ඡන්ද නාම ලේඛන ඉදිරිපත් නොකරන විට හෝ කොට්ඨාස භාර සහකාර කොමසාරිස්වරයා විසින් වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු/නිලධාරීන් මගින් ඡන්ද නාම ලේඛන සකස් කරවාගෙන, ඒවා සහතික කර එසේ සහතික කරන ලද එම ඡන්ද නාම ලේඛනවලට අනුව ප්‍රාදේශික කාරක සභාවලට සාමාජිකයින් පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි. ඒ අයුරින් සහතික කරන ලද ඡන්ද නාම ලේඛන සමිතියේ නාම යෝජනා භාර ගැනීමට නියමකර ඇති දිනයට අවම වශයෙන් දින 03 කටවත් පෙර කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාර දිය යුතුයි.

(ආ) ඉහත (අ) ඡේදයට අනුව ඡන්ද නාම ලේඛන සකස් කිරීම සඳහා සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය හා සාමාන්‍යාධිකාරී, ලේකම් ඇතුළු සමිතියේ සියලුම සේවකයින් වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියාට/නිලධාරීන්ට අවශ්‍ය වන සියලුම පහසුකම් හා සහයෝගය ලබාදීමට බැඳී සිටියි. ඡන්ද නාම ලේඛන සකස් කිරීම සඳහා දැරීමට සිදුවන සියලුම වියදම් ද අදාළ සමිතිය විසින් දැරිය යුතුයි.

(ඇ) 8.3 නිලවරණ නියෝගයේ සඳහන් කර ඇති යම් නිලවරණ කාර්යයක් ඉටු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී, එසේ පැහැර හරින ලද නිලවරණ කාර්යයන් ඉටුකිරීමට මෙම නිලවරණ නියෝග මාලාවෙන් නියම කර ඇති අවසාන දිනයේ සිට උපරිම වශයෙන් දින 21 ක් ඇතුළත තම නිලධාරීන් මගින් අදාළ නිලවරණ කාර්යයන් ඉටුකිරීම ආරම්භ කිරීමට කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් විධිවිධාන යෙදිය යුතුයි.

(ඈ) කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් තම නිලධාරීන් මගින් ඡන්ද නාම ලේඛන සකස්කර ගත් වහාම ඔහු ඒ බව වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දිය යුතුයි. ඒ අනුව එම ඡන්ද නාම ලේඛන ප්‍රදර්ශනය කිරීම, ඡන්ද නාම ලේඛනයකට ඇතුළත් වී නැති නමක් ඇතුළත් කර ගැනීම සඳහා අභියාචනා භාරදීම හෝ ඇතුළත්කර ඇති නමක් පිළිබඳව විරෝධතා ඉදිරිපත් කිරීම සිදුකළ යුතු දින වකවානු හා ස්ථාන පිළිබඳව වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු අතර, ඔහු ඒ පිළිබඳ විස්තර අවම වශයෙන් ජාතික පුවත්පත් 02 කවත් ප්‍රකටව දැන්වීම් පළකළ යුතුයි.

8.4 8.1 (ඇ) නිලවරණ නියෝගයට අනුව කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස් විසින් සහතික කර එවන ලද ඡන්ද නාම ලේඛන පිටපත් 02 කින් එක් පිටපතක් නාම යෝජනා භාරගැනීමට නියමකර ඇති දිනයට අවම වශයෙන් දින 03 කටවත් පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලිඛිතව භාරදිය යුතුයි. 8.1 (ඇ) හෝ 8.3 (අ) හෝ යන නිලවරණ නියෝගයට අනුව තමන්ට භාරදුන් ඡන්ද නාම ලේඛන යටත් පිරිසෙයින් නාම යෝජනා භාරගන්නා දින හෝ ඡන්දය විමසන දින හෝ පෙ.ව. 7.00 ට වත් පෙර ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට භාර දිය යුතුයි.

8.5 නාම යෝජනා භාරගන්නා දිනයේ හෝ ඡන්දය විමසන දිනයේ දී හෝ නිලවරණ කටයුතු අවසන් වූ පසු ඡන්ද නාම ලේඛනය මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාර දිය යුතුයි. එම ඡන්ද නාම ලේඛන වලින්; ඡන්ද විමසීමක් සිදු නොවන විට නාම යෝජනා භාරගත් දිනයෙන් පසුව හෝ ඡන්ද විමසීමක් සිදුවන විට ඡන්ද විමසීම සිදු වූ දිනයෙන් පසුව හෝ දින 03 ක් ඇතුළත ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් 8.4 නිලවරණ නියෝගයට අනුව ලැබුණු ඡන්ද නාම ලේඛන සමිතියේ ලේකම්ට ද, 8.3 (අ) නිලවරණ නියෝගයට අනුව ලැබුණු ඡන්ද නාම ලේඛන කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට ද භාරදිය යුතුයි.

8.6 8.5 නිලවරණ නියෝගයට අනුව ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සමිතියේ ලේකම්ට භාරදුන් ඡන්ද නාම ලේඛන අවම වශයෙන් අවුරුදු 01ක් වත් සුරක්ෂිතව තමා භාරයේ තබාගැනීමේ වගකීම ලේකම්ට පැවරේ. ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත භාර දෙන ඡන්ද නාම ලේඛන මාස 06 ක් වත් සුරක්ෂිතව තබා ගත යුතු අතර, නිලවරණය පිළිබඳව යම් නීති කෘත්‍යයක් ආරම්භ වී නැත්නම් මාස 06 කින් පසු එම නාම ලේඛන සම්බන්ධයෙන් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට තම අභිමතය අනුව සුදුස්සක් කළ හැක.

### III කොටස - පූර්ව නිලවරණ සංවිධාන කටයුතු

නාම යෝජනා භාර ගන්නා දිනය හා ඡන්දය විමසන දිනය නියම කිරීම හා කල් දැමීම.

9.1 සමිතියේ මහා සභාවේ නිල කාලය අවසන් වන දිනට මාස 03 කට කලින් පහත සඳහන් කර ඇති තොරතුරු සමිතියේ ලේකම් විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට ලබාදිය යුතුයි.

(අ). සමිතියේ මහා සභාවේ නිල කාලය අවසන් වන දිනට මාස 03 කට කලින් නිලවරණය පැවැත්වීමට නියමිත ඡන්ද මධ්‍යස්ථානවල (ප්‍රාදේශිකවල) නම්, හා 4.1 නිලවරණ නියෝගයට අනුව ප්‍රාදේශිකයට අනුයුක්ත ඡන්දය හිමි සාමාජික සංඛ්‍යාව සමිතියේ ලේකම් විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතුයි.

(ආ). යම් ඡන්ද ප්‍රදේශයක් තුළ ප්‍රාදේශිකයක් නොමැති අවස්ථාවල දී 3(2) නිලවරණ නියෝගයේ සඳහන් කරුණුවලට හා ඉහත (අ) ඡේදයට අනුකූලව ඡන්ද ප්‍රදේශය තුළ ස්ථාපිතව ඇති ප්‍රාදේශික මහා සභාවේ නම, පිහිටුවීමට බලාපොරොත්තු වන ඡන්ද මධ්‍යස්ථානයේ නම,ලිපිනය හා ප්‍රාදේශික මහ සභාවේ සිටින ඡන්දය හිමි සාමාජික සංඛ්‍යාව සමිතියේ ලේකම් විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතුයි.

9.2 ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා නාමයෝජනා භාර ගැනීමේ දිනය හා ඡන්දය විමසීමේ දිනය නියම කළ යුත්තේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසිනි. එසේ නියම කරනු ලබන දිනයන් අතුරු ව්‍යවස්ථාවට පටහැනි නොවන අන්දමට වෙනස් කිරීමේ බලය ද වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා සතුවේ. මෙම නිලවරණ නියෝගයට අනුව නියම කරන හෝ සංශෝධනය කරන හෝ දින පිළිබඳව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරුන්ට දැනුම් දිය යුතුයි.

9.3 9.2 නිලවරණ නියෝගයට අනුව දන්වන නාමයෝජනා භාරගැනීමට හා ඡන්ද විමසීමට අදාළ දින පිළිබඳව කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරයා විසින් 10.1 (අ) නිලවරණ නියෝගයට අනුව පත්කරන ප්‍රධාන ඡන්ද නිලධාරියාට ද 10.1 (අ) හා (ඇ) යන නිලවරණ නියෝගවලට අනුව පත්කරන ලද සියලුම මධස්ථාන භාර ඡන්ද නිලධාරින්ට, ඡන්ද නිලධාරින්ට, සහකාර ඡන්ද නිලධාරින්ට හා සමිතියේ ලේකම්වරයාට ද දැනුම් දිය යුතුයි.

ඡන්ද නිලධාරින් පත් කිරීම,ඡන්ද නිලධාරින්ගේ බලතල හා වගකීම සහ ස්වකීය කාර්යයන් ඉටුකිරීමට නොහැකි වන ඡන්ද නිලධාරින්ගේ කාර්යයන් සම්බන්ධයෙන් ගතයුතු පියවර

10.1 පහත සඳහන් කර ඇති පරිදි සමිතියක් සඳහා ප්‍රධාන ඡන්ද නිලධාරියෙක් ඇතුළු අනෙකුත් ඡන්ද නිලධාරින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් පත් කළ යුතුයි.

(අ). කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් 3.1 නිලවරණ නියෝගයේ සඳහන් වන ඡන්ද කොට්ඨාසයක් සඳහා එම කොට්ඨාසය තුළ පිහිටා ඇති ඡන්ද මධ්‍යස්ථානවල නාම යෝජනා භාරගන්නා දිනයට මාස 01 කටවත් පෙර ප්‍රධාන ඡන්ද නිලධාරියෙක් පත්කළ යුතුයි.

(ආ). 3.1 නිලවරණ නියෝගයේ සඳහන් වන ඡන්ද ප්‍රදේශයක් සඳහා මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියෙක් ද, එම නිලධාරියාගේ සහාය සඳහා අවශ්‍ය බවට කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා තීරණය කරන සහකාර ඡන්ද නිලධාරින් සංඛ්‍යාවක් ද කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් පත්කළ යුතුයි.

(ඇ). මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරින්ට හා සහකාර ඡන්ද නිලධාරින්ට අමතරව තම අභිමතය පරිදි ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ සහායට අවශ්‍ය වන ඡන්ද නිලධාරින් හා සහකාර ඡන්ද නිලධාරින් සංඛ්‍යාවක් ද කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට පත්කළ හැක.

(ඈ). මෙම නිලවරණ නියෝගයේ (අ),(ආ) හා (ඇ) යන ඡේදවල සඳහන් සියලු තනතුරු සඳහා පත්වීම් ලිපි නිකුත් කළ යුත්තේ මෙම නිලවරණ නියෝග මාලාවේ දෙවන උපලේඛනයේ සඳහන් "අ"ආකෘතියට සාරානුකූලවයි.

10.2 10.1 (අ), (ආ) හා (ඇ) යන නිලවරණ නියෝගවලට අනුව යම් ඡන්ද කොට්ඨාසයකට / ඡන්ද ප්‍රදේශයකට පත්කරන ලද යම් නිලධාරියෙකු නිලවරණ නියෝගවල සඳහන් කාර්යයන් ඉටුකරන අතරතුර මිය යාම හෝ ඉල්ලා අස්වීම හෝ රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා හෝ නිලවරණ නියෝග මාලාවේ සඳහන් කාර්යයන් තව දුරටත් ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක දී ඒ සම්බන්ධයෙන් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් නියෝගයක් නිකුත් කරනතුරු ඉහත කී නිලධාරියා

විසින් මෙම නිලවරණ නියෝග මාලාවට අනුව සිදුකළ යුතු කාර්යයන් බාධාවකින් තොරව අඛණ්ඩව කරගෙන යාම සහතික කිරීම සඳහා 10.3 නිලවරණ නියෝගයට අනුව නිලධාරියෙකු පත්කරනතුරු 10.1 (අ), (ආ) හා (ඇ) යන නිලවරණ නියෝගය යටතේ එම ඡන්ද කොට්ඨාසයටම හෝ ඡන්ද ප්‍රදේශයටම හෝ පත්වීම් ලැබූ ඕනෑම නිලධාරියෙකු විසින් ඉහත කී කාර්යයන් ඉටුකිරීමට නොහැකි වූ නිලධාරියාගේ නිලවරණ නියෝග මාලාවට අදාළ කාර්යන් ඉටුකිරීම නීත්‍යානුකූල වන්නේය. එවැනි අවස්ථාවක දී ස්වකීය කාර්යයන් ඉටුකිරීමට අපොහොසත් නිලධාරියාගේ තනතුර, එවැනි නිලධාරියෙකුගේ කාර්යයන් තත් කාලයේ ඉටුකරන නිලධාරියාගේ ද තනතුර වන්නේය.

10.3 මෙවැනි අවස්ථාවක දී කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් නොපමාවම නිලවරණ නියෝග මාලාවේ කාර්යයන් ඉටුකිරීමට නොහැකි වූ නිලධාරියාගේ තනතුරට වෙනත් නිලධාරියෙකු පත්කිරීම හෝ 10.2 නිලවරණ නියෝගයට අනුව දැනටමත් එම කාර්යයන් ඉටුකරන නිලධාරියාවම පත්කිරීම හෝ කළ යුතුයි.

10.4 10.2 නිලවරණ නියෝගයට යටත්ව 10.1 හා 10.3 යන නිලවරණ නියෝගවලට අනුව පත්කරනු ලබන ප්‍රධාන ඡන්ද නිලධාරියාට, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන්ට, ඡන්ද නිලධාරීන්ට හා සහකාර ඡන්ද නිලධාරීන්ට මෙම නිලවරණ නියෝග මාලාවේ තමන්ට නිශ්චිතව පවරා ඇති බලතල භාවිතා කළ හැක.

10.5 පහත සඳහන් කර ඇති පරිදි 10.1 හා 10.3 යන නිලවරණ නියෝගවලට අනුව පත්කරන හෝ 10.2 නිලවරණ නියෝගයට අනුව කටයුතු කරන හෝ ප්‍රධාන ඡන්ද නිලධාරියා ඇතුළු අනෙකුත් ඡන්ද නිලධාරීන් මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් නිලවරණ කටයුතු නිසි පරිදි ඉටුකිරීම පිළිබඳව වගකිව යුතුයි.

(අ) නාම යෝජනා භාරගන්නා දිනය සමිතියේ ලේකම්ට දැන් වූ අවස්ථාවේ සිට ප්‍රාදේශික කාරක සභාවලට සාමාජිකයින් පත්කර ගැනීමට අදාළ සමස්ථ ඡන්ද ප්‍රතිඵල කොමසාරිස්වරයාට දන්වන අවස්ථාව දක්වා වූ සියලුම නිලවරණ කටයුතු නිසියාකාරව හා විනිවිදභාවයෙන් යුතුව පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රධාන ඡන්ද නිලධාරියා සහ ඔහුගේ සහායට පත්කරන ලද ඡන්ද නිලධාරීන්/සහකාර ඡන්ද නිලධාරීන් කොමසාරිස්වරයාට වගකිව යුතුයි.

(ආ) ඡන්ද මධ්‍යස්ථානයක නාම යෝජනා භාරගත් අවස්ථාවේ සිට එම ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද ප්‍රතිඵල ප්‍රධාන ඡන්ද නිලධාරියාට දන්වන අවස්ථාව දක්වා වූ සියලුම නිලවරණ කටයුතු නීත්‍යානුකූලව හා විනිවිදභාවයෙන් යුතුව පැවැත්වීම සම්බන්ධයෙන් ඡන්ද මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන්/සහකාර ඡන්ද නිලධාරීන් කොමසාරිස්වරයාට සහ ප්‍රධාන ඡන්ද නිලධාරියාට වගකිව යුතුයි.

10.6 මෙම නිලවරණ නියෝග මාලාවට අනුව නිලවරණය පැවැත්වීම සඳහා ප්‍රධාන ඡන්ද නිලධාරියාට / මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට/ඡන්ද නිලධාරීන්ට/සහකාර ඡන්ද නිලධාරීන්ට අවශ්‍ය වන සියලුම පහසුකම් හා සම්පූර්ණ සහයෝගය අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමිතියේ සියලුම කාර්ය මණ්ඩලය විසින් ලබාදිය යුතුයි.

*නාම යෝජනා භාර ගැනීම හා ඡන්දය පැවැත්වීම පිළිබඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම*

11.1 යම් ඡන්ද මධ්‍යස්ථානයක නාම යෝජනා භාරගැනීමට නියමිත දිනයට අවම වශයෙන් සති 04 කටවත් පෙර නාම යෝජනා භාරගන්නා, නාම යෝජනා සඳහා විරෝධතාවයන් භාරගන්නා සහ ඡන්දය පවත්වන දින, වේලාවන්, නිලවරණ කටයුතු සිදුකරන ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ විස්තර ද ඇතුළත් ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීමට අදාළව ප්‍රදර්ශනය කළ යුතු දැන්වීමේ ආදර්ශයක්, සමග අවශ්‍ය කරන දැන්වීම් ප්‍රමාණය ද එම දැන්වීම මුද්‍රණය කර ලබාදිය යුතු අවසාන දිනය ද පිළිබඳව, ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සමිතියේ ලේකම් වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

11.2 11.1 නිලවරණ නියෝගයේ සඳහන්වන අන්දමට නියමිත ආදර්ශයට අනුව ලබා දිය යුතු බවට නියම කර ඇති දැන්වීම් ප්‍රමාණය, නියමිත දිනයේ දී හෝ ඊට පෙර ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබාදීම ලේකම්ගේ වගකීමකි.

11.3 11.2 නිලවරණ නියෝගයට අනුව ලේකම් විසින් ප්‍රධාන ඡන්ද නිලධාරී වෙත භාර දෙන දැන්වීම් සමිතියේ ප්‍රධාන කාර්යාලයේ, ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රාදේශික බල ප්‍රදේශය තුළ පිහිටි ජනාකීර්ණ ස්ථානවල, ග්‍රාම නිලධාරී කාර්යාලවල හා ග්‍රාමීය බැංකු ශාඛාවල ද, සමිතියේ අධීක්ෂණය භාර සහකාර කොමසාරිස් කාර්යාලයේ ද ප්‍රදර්ශනය කළ යුතු බවට නියම කරමින් ප්‍රධාන ඡන්ද නිලධාරී විසින්

සාමාන්‍යාධිකාරීට ලිඛිතව භාරදිය යුතුයි. එකී දැන්වීම් නියමිත ස්ථානවල නියමිත කාලය තුළ ප්‍රදර්ශනය කිරීමේ හා එවැනි ස්ථානවල එම දැන්වීම ප්‍රදර්ශනය කළ බවට තහවුරු කරන ලිඛිත සාක්ෂි ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාර දීමේ සම්පූර්ණ වගකීම සාමාන්‍යාධිකාරී වෙත පැවරේ.

11.4 11.3 නිලවරණ නියෝගයට අනුව ප්‍රදර්ශනය කරන දැන්වීම් අවම වශයෙන් නාම යෝජනා භාර ගැනීමට නියමිත දිනට සති 02කටවත් කලින් සිට ප්‍රදර්ශනය කරවීමට අවශ්‍ය විධිවිධාන යෙදවීම හා එම දැන්වීම් නියමිත ස්ථානවල නියමිත කාලය තුළ ප්‍රදර්ශනය කරන බවට තහවුරු කර ගැනීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි.

නිලවරණයට අවශ්‍ය වන ලිපිද්‍රව්‍ය, ආකෘතිපත්‍ර, සමිතියේ කාර්ය මණ්ඩලය, ප්‍රවාහන පහසුකම් හා වෙනත් දෑ සැපයීම.

12.1 යම් ඡන්ද මධ්‍යස්ථානයක නාම යෝජනා භාර ගැනීමට නියමිත දිනයට අවම වශයෙන් සති 03කටවත් පෙර නිලවරණ කටයුතු සඳහා අවශ්‍ය වන 11.1 නිලවරණ නියෝගයෙන් ආවරණය නොවන අනෙකුත් සියලුම ලිපිද්‍රව්‍ය,ජර්නලය, ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි, ඡන්ද සලකුණු කරන ඡන්ද කුටි හා මුද්‍රණය කර භාර දිය යුතු සියලුම ආකෘති පත්‍ර ඒවා ලබා දිය යුතු බවට තමන් නියම කර ඇති ආදර්ශ වලට, ප්‍රමාණවලට හා දිනවලට අනුව ලබා දිය යුතු බවටත්, ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සාමාන්‍යාධිකාරිවරයාට ලිඛිතව නියම කළ යුතුයි.

12.2 12.1 නිලවරණ නියෝගයේ සඳහන් වන අන්දමට ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් තමන්ට ලබා දෙන ලෙසට නියම කර ඇති සියලුම දෑ නියමිත ප්‍රමාණයෙන්, නියම කර ඇති දිනයට හෝ ඊට පෙර ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබා දීම සාමාන්‍යාධිකාරිවරයාගේ වගකීමකි.

12.3 12.1 නිලවරණ නියෝගයට අනුව ලබා ගන්නා දෑ සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති පරිදි කටයුතු කිරීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි :

(අ) 12.1 නිලවරණ නියෝගයේ සඳහන් කර ඇති සියලුම දෑ අවම වශයෙන් නාමයෝජනා භාර ගැනීමට නියමිත දිනයට සති 01 කටවත් කලින් සාමාන්‍යාධිකාරිවරයාගෙන් තමන් වෙත ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදවීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි,

(ආ) ඉහත (අ) ඡේදයට අනුව ලබා ගන්නා දෑවලින් අදාල වන පරිදි නාම යෝජනා භාර ගන්නා දිනයේ දී ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවල මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන්ට/සහකාර ඡන්ද නිලධාරීන්ට භාර දීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි,

(ඇ) ඉහත (අ) ඡේදයට අනුව ලබා ගන්නා දෑවලින් අදාල වන පරිදි ඡන්දය පවත්වන දිනයේ දී ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවල මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන්ට/සහකාර ඡන්ද නිලධාරීන්ට භාර දීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි.

12.4 යම් ඡන්ද මධ්‍යස්ථානයක නාම යෝජනා භාර ගැනීමට සති 02 කටවත් පෙර නාම යෝජනා භාර ගැනීම හා ඡන්දය පැවැත්වීම යන නිලවරණ කටයුතු සඳහා ඒ ඒ දිනවල දී අවශ්‍ය වන සමිතියේ කාර්ය මණ්ඩල ප්‍රමාණය , නිලවරණ දින සඳහා සකස් කළ ප්‍රවාහන සැලැස්ම ද සමග අවශ්‍ය වන වාහන ප්‍රමාණය සහ ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවල අවම වශයෙන්වත් තිබිය යුතු බවට නිශ්චය කරන ලද ලී බඩු, වෙනත් උපකරණ සහ ප්‍රමාණය ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සාමාන්‍යාධිකාරිවරයාට ලිඛිතව දැන්විය යුතුයි.

12.5 12.4 නිලවරණ නියෝගයේ සඳහන් වන අන්දමට ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් ලබාදෙන ලෙසට නියම කර ඇති කාර්ය මණ්ඩලය හා වාහන ප්‍රමාණය ඒ ඒ දිනවල දී නියම කර ඇති ආකාරයට ප්‍රධාන ඡන්ද නිලධාරී වෙත ලබා දීමටත් , ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවල තිබිය යුතු බවට නියම කර ඇති ලී බඩු හා උපකරණ නියමිත දිනයන්වල දී ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවලට සැපයීම සාමාන්‍යාධිකාරීවරයාගේ වගකීමකි.

12.6 12.5 නිලවරණ නියෝගයට අනුව නිලවරණ කටයුතු සඳහා ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබාදෙන සමිතියේ කාර්ය මණ්ඩලය අනුයුක්ත කළ යුතු ස්ථාන ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් තීරණය කළ යුතු අතර, තමන්ට ලබා දුන් කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම පත්වීම් ලිපි නිකුත් කිරීම ද කළ යුතුයි. එම පත්වීම් ලිපිය මෙම නිලවරණ නියෝග මාලාවේ තුන්වන උපලේඛනයේ සඳහන් "අ" ආකෘතියට සාරානුකූල විය යුතුයි.

12.7 12.3 (ආ) නිලවරණ නියෝගයට අනුව නාමයෝජනා භාර ගන්නා දිනයේ දී මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට/සහකාර ඡන්ද නිලධාරියාට භාරදෙන සියලුම දේ භාරදිය යුත්තේ 51.1 නිලවරණ නියෝගයට

අනුව නිකුත් කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත් වන ලිපිද්‍රව්‍ය හා භාණ්ඩ භාර දීමේ ආකෘතියට සාරානුකූල ආකෘතියකිනි.

12.8 12.3 (ඇ)නිලවරණ නියෝගයට අනුව ඡන්දය පවත්වන දිනයේදී මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට භාරදෙන සියලුම දේ භාරදිය යුත්තේ 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත් වන ලිපි ද්‍රව්‍ය හා භාණ්ඩ භාර දීමේ ආකෘතියට සාරානුකූල ආකෘතියකිනි.

13.1 නාම යෝජනා කැඳවීමට නියම කර ඇති දිනයට අවම වශයෙන් මාස 01 ට වත් පෙර නාම යෝජනා භාර ගැනීම හා ඡන්දය පැවැත්වීම වෙනුවෙන් එක් එක් ඡන්ද මධ්‍යස්ථානවල ආරක්ෂාවට අවශ්‍ය වන පොලිස් නිලධාරින්ගේ සංඛ්‍යාව සමිතිය භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී මගින් ලබාගෙන, අවශ්‍ය වන පොලිස් නිලධාරින් සංඛ්‍යාව ශ්‍රී ලංකා පොලීසියෙන් ලබා දෙන ලෙසට නාම යෝජනා කැඳවීමට නියම කර ඇති දිනයට අවම වශයෙන් සති 04 කටවත් පෙර කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් ප්‍රදේශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් ඉල්ලා සිටිය යුතුයි. නිලවරණයට අවශ්‍ය වන පොලිස් ආරක්ෂාව.

## *IV* කොටස - *නාමයෝජනා*

14.1 තත් කාලයේ වලංගු සමුපකාර නීතියට අනුව ලියාපදිංචි සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවකට තෝරා පත්කළ නොහැකි බවට සඳහන්කර ඇති නුසුදුසුකම් වලින් පෙලෙන කිසිම සාමාජිකයෙකුට ප්‍රාදේශික කාරක සභාවකට තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන නිලවරණයකදී ඡන්ද අපේක්ෂකයෙක් ලෙස නාම යෝජනා ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත. නාම යෝජනා ඉදිරිපත් කිරීමට හිමිකම් නොමැති පුද්ගලයන්.

14.2 11.1 නිලවරණ නියෝගයෙහි සඳහන් වන දැන්වීමේ නාමයෝජනා ඉදිරිපත් කිරීමට හිමිකම් නොමැති පුද්ගලයන් ලෙස ඇතුළත් කළ යුත්තේ , තත් කාලයේ වලංගු සමුපකාර නීතිවලට යටත්ව තත් කාලයේ වලංගු සමුපකාර සමිති රීති මාලාවේ ලියාපදිංචි සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවකට තෝරා පත්කළ නොහැකි බවට සඳහන් වන පුද්ගලයන් වේ.

15.1 ප්‍රාදේශික කාරක සභාවකට තේරී පත්වීමට ඉදිරිපත් වන ඡන්ද අපේක්ෂකයෙකුගේ නම සමිතියේ සාමාජිකයෙකු විසින් යෝජනා කර , තවත් සාමාජිකයෙකු විසින් ස්ථිර කර තිබිය යුතු අතර , 15.4 නිලවරණ නියෝගයේ සඳහන් ආකෘති පත්‍රයට සෑම අතින්ම අනුකූල වන අන්දමේ ආකෘති පත්‍රයකින් නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කළ යුතුයි. නාම යෝජනා පත්‍ර සකස් කළ යුතු ආකාරය.

15.2 ඡන්ද අපේක්ෂකයා , යෝජනාකරු මෙන්ම ස්ථිරකරු ද 8.2 නිලවරණ නියෝගයේ සඳහන් ඡන්ද නාම ලේඛනයේ නම ඇතුළත් වන අයෙක් විය යුතුයි.

15.3 ඡන්ද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත්වීමට තමන් කැමැත්ත පල කරන බව හා 14.1 නිලවරණ නියෝගයේ සඳහන් වන නුසුදුසුකම් තමන්ට නොමැති බව සෑම ඡන්ද අපේක්ෂකයෙකු විසින් ද , තමන් 8.2 නිලවරණ නියෝගයේ සඳහන් වන පරිදි සකස් කරන ලද ප්‍රාදේශිකයේ ඡන්ද නාම ලේඛනයේ නම සඳහන් වන සාමාජිකයින් බවට ඡන්ද අපේක්ෂකයා , යෝජනාකරු හා ස්ථිරකරුද කරන ලද ප්‍රකාශ නාම යෝජනා පත්‍රයට ඇතුළත් වී තිබිය යුතුයි.

15.4 නාම යෝජනා පත්‍රය පිටපත් 04 කින් යුතුව සකස් කළ යුතුයි. ඒ නාම යෝජනා පත්‍රය මෙම නිලවරණ නියෝග මාලාවේ හතරවන උපලේඛනයේ දක්වා ඇති ''අ'' ආකෘතියට සාරානුකූල විය යුතුයි.

## ***V* කොටස**

*නාම යෝජනා භාර ගන්නා දිනයේ නිලවරණ කටයුතු*

නාම යෝජනා පත්‍ර භාර ගැනීම හා ප්‍රතික්ෂේප කිරීම.

16.1 යම් ප්‍රාදේශිකයක් සඳහා නාම යෝජනා භාර ගැනීමට නියම කර ඇති දින නියමිත ඡන්ද මධ්‍යස්ථානයේ දී පෙ.ව.9.00 සිට පෙ.ව. 10.00 දක්වා වූ කාලය තුළදී පමණක් 15.1, 15.2, 15.3, හා 15.4 යන නිලවරණ නියෝගවලට අනුකූලව සකස් කරන ලද නාම යෝජනා පත්‍රය, එම නාම යෝජනා පත්‍රයේ සඳහන් වන ඡන්ද අපේක්ෂකයා, හෝ යෝජනාකරු හෝ ස්ථිරකරු හෝ යන තිදෙනාගෙන් එක් අයෙකු විසින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට භාර දිය යුතුයි.

16.2 තමන් වෙත භාර දෙනු ලැබූ නාම යෝජනා පත්‍රයක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියෙකු / සහකාර ඡන්ද නිලධාරියෙකු විසින් ප්‍රතික්ෂේප කළ යුත්තේ පහත සඳහන් කර ඇති අවස්ථාවලදී පමණි.

(I). 15.1, 15.2, 15.3 හා 15.4 යන නිලවරණ නියෝගවලට පටහැනිව නාම යෝජනා පත්‍රයක් භාර දී ඇති අවස්ථාවක,

(II). 16.5 නිලවරණ නියෝගයේ සඳහන් වන අන්දමට නාම යෝජනා පත්‍රයක් භාර දී ඇති අවස්ථාවක.

16.3 16.2 නිලවරණ නියෝගයට අනුව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ප්‍රතික්ෂේප නොකරන ලද නාම යෝජනා පත්‍රයක පිටපත් 02 ක් නොපමාවම ඡන්ද මධ්‍යස්ථානයේ සුදුසු ස්ථානයක අලවා ප්‍රකටව ප්‍රදර්ශනය කිරීමටත්, නාම යෝජනා පත්‍රයේ ඉතිරි පිටපත් 02 ක තමන්ගේ භාරයේ සුරක්ෂිතව තබා ගැනීමටත්, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් කටයුතු කළ යුතුයි.ඒ අයුරින් ප්‍රතික්ෂේප නොකරන ලද නාම යෝජනා පත්‍රවල පිටපත් ප්‍රදර්ශනය කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානයේ සුදුසු ස්ථානයක ඇලවීම පෙ.ව. 10.01 ට පෙර සිදුකර අවසන් කළ යුතුයි.

16.4 16.3 නිලවරණ නියෝගයට අනුව ප්‍රදර්ශනය කළ යුතු නාම යෝජනා පත්‍ර පෙ.ව. 10.01 සිට පෙ.ව. 11.00 දක්වා කාලය තුළදී ප්‍රදර්ශනය කිරීම සිදුකළ යුතුයි. පෙ.ව. 11.00 න් පසු එසේ ප්‍රදර්ශනය කරන ලද නාම යෝජනා පත්‍ර ඉවත් කිරීමට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් කටයුතු කළ යුතුයි.

16.5 එසේ වුවද මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් තම නාම යෝජනා පත්‍රය පිළිගෙන තිබියදී තවත් නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට කිසිම ඡන්ද අපේක්ෂකයෙකුට හිමිකමක් නැත. එවැනි අවස්ථාවකදී ඒ වන විට ඡන්ද අපේක්ෂකයාගේ පිළිගෙන තිබූ නාම යෝජනා පත්‍රය හැර, ඊට පසුව එම ඡන්ද අපේක්ෂකයා විසින් ඉදිරිපත් කරන සියලුම නාම යෝජනා පත් ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා කටයුතු කළ යුතුයි.

16.6 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට ලැබුණු සියලුම නාම යෝජනා පිළිබඳ විස්තර 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත් වන ජර්නලයේ i කොටසේ සඳහන් "අ" ආකෘතියට සාරානුකූල ආකෘතියක මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් සටහන් කළ යුතුයි.

16.7 16.2 හා 17.2 යන නිලවරණ නියෝගවලට අනුව ප්‍රතික්ෂේප කරන ලද නාම යෝජනා පිළිබඳ විස්තර 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත් වන ජර්නලයේ i කොටසේ සඳහන් "ආ" ආකෘතියට සාරානුකූල ආකෘතියක මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් සටහන් කළ යුතුයි.

විරෝධතා භාර ගැනීම

17.1 යම් ප්‍රාදේශිකයක් සඳහා නාම යෝජනා භාර ගැනීමට නියම කර ඇති දින නියමිත ඡන්ද මධ්‍යස්ථානයේදී පෙ.ව. 10.01 සිට පෙ.ව. 11.00 දක්වා වූ කාලය තුළදී පමණක් 8.2 නිලවරණ නියෝගයේ සඳහන් වන ප්‍රාදේශිකයේ ඡන්ද නාම ලේඛනයේ නම ඇතුළත් වී ඇති ඕනෑම සාමාජිකයෙකුට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් 16.2 නිලවරණ නියෝගයට අනුව ප්‍රතික්ෂේප නොකරන ලද ඕනෑම නාම යෝජනාවක් පිළිබඳව තම විරෝධතා ලිඛිතව ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

(ඈ). 17.2 නිලවරණ නියෝගයට අනුව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට ලැබුණු සියලුම විරෝධතා පිළිබඳ විස්තර 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත් වන ජර්නලයේ i කොටසේ සඳහන් "ඇ" ආකෘතියට සාරානුකූල ආකෘතියක මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් සටහන් කළ යුතුයි.

17.2 17.1 නිලවරණ නියෝගයට අනුව සාමාජිකයෙකුට යම් නාම යෝජනාවක් පිළිබඳව විරෝධතාවයන් ඉදිරිපත් කළ හැක්කේ පහත සඳහන් කර ඇති කරුණු සඳහා පමණී :

(අ) ඡන්ද අපේක්ෂකයාට 14.1 හා 14.2 යන නිලවරණ නියෝගවල සඳහන් නුසුදුසුකම් එකක් හෝ එකට වැඩි නුසුදුසුකම් හෝ තිබීම.

(ආ) ඡන්ද අපේක්ෂකයාගේ හෝ යෝජනාකරුගේ හෝ ස්ථිරකරුගේ හෝ නම / සාමාජික අංකය 8.2 නිලවරණ නියෝගයේ සඳහන් ප්‍රාදේශිකයේ ඡන්ද නාම ලේඛනයේ නොමැති විට.

(ඇ) ඡන්ද අපේක්ෂකයා හෝ යෝජනාකරු හෝ ස්ථිරකරු හෝ නොවන වෙනත් අයෙකු විසින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට යම් ඡන්ද අපේක්ෂකයෙකුගේ නාමයෝජනා පත්‍රයක් භාර දී ඇති අවස්ථාවක.

(ඈ) 16.2 නිලවරණ නියෝගයෙහි සඳහන් වන අන්දමට නාම යෝජනා පත්‍රයක් භාර දී ඇති අවස්ථාවක

17.3 17.2 (ආ). 17.2 (ඇ) හා 17.2 (ඈ) යන නිලවරණ නියෝග යටතේ සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවයක් / විරෝධතාවයන් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා පිළිගනු ලැබුවහොත්, ඒ විරෝධතාවයට අදාළ නාම යෝජනා පත්‍රය මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතුයි.

17.4 17.1 හා 17.2 යන නිලවරණ නියෝගවලට අනුව ඉදිරිපත් වූ සියලුම විරෝධතාවයන් මුද්‍රා තබා, එම විරෝධතාවයන් භාරගත් දිනම මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරී / සහකාර ඡන්ද නිලධාරී විසින් ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාර දිය යුතුයි.

17.5 17.2 (ආ),17.2(ඇ) සහ 17.2 (ඈ) යන නිලවරණ නියෝගවල සඳහන් වන විරෝධතා සියල්ල, එම විරෝධතා භාරගත් දිනයේ සිට වැඩ කරන දින 03 ක් ඇතුළත ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට භාර දිය යුතුයි.

17.6 17.2 (අ) නිලවරණ නියෝගය යටතේ සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති සියලුම විරෝධතා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම සඳහා විරෝධතා භාරගත් දිනයේ සිට වැඩකරන දින 03 ක් ඇතුළත ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට භාර දිය යුතුයි.

17.7 17.6 නිලවරණ නියෝගයට අනුව ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් තමා වෙත භාර දුන් විරෝධතා පිළිබඳව තම නිරීක්ෂණ හා නිර්දේශ ද සමග දින 21 ක් ඇතුළත කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුයි.

17.8 තමා වෙත ලැබුණු 17.2 (අ) නිලවරණ නියෝගයේ සඳහන් විරෝධතාවයන් පිළිබඳව පරීක්ෂණයක් කර, විරෝධතාවය එල්ල වූ ඡන්ද අපේක්ෂකයාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව එවැනි විරෝධතාවයන් පිළිගතයුතු බවට වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළහොත් සහ එම තීරණය කරන අවස්ථාවේ දී, විරෝධතාවයන්ට ලක් වූ ඡන්ද අපේක්ෂකයා කාරක සභිකයෙක් ලෙස තේරී පත් වී ඇත්නම් වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ විරෝධතාවය පිළිගත් අවස්ථාවේ සිට එම සාමාජිකයාගේ කාරක සභික ධූරය දැරීම අවසන් විය යුතුයි.

17.9 17.8 නිලවරණ නියෝගයේ සඳහන් වන වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වේ.

17.10 පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කර ඇති විරෝධතා පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන, එම විරෝධතා ප්‍රධාන ඡන්ද නිලධාරියා මගින් කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරයා වෙත යැවිය යුතුයි. කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරයා විසින් තමන්ට ලැබුණු එවැනි විරෝධතා, නාම යෝජනා භාරගත් දිනයේ සිට මාස 06 ක් ගතවන තුරු තම භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුයි. එම විරෝධතා පිළිබඳව යම් අධිකරණයක් ඉදිරියේ නීති කෘත්‍යයක් සිදු වෙමින් පවතින අවස්ථාවකදී හැර මාස 06 කින් පසු එම සියලු විරෝධතා කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ විනාශ කළ යුතුයි.

(අ) 8.2 නිලවරණ නියෝගයේ සඳහන් ප්‍රාදේශිකයේ ඡන්ද නාම ලේඛනයේ නම සඳහන් නොවන අයෙකු විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවයන්.

**ඡන්ද අපේක්ෂකයින් නිතරගයෙන් තේරී පත්වූ බව නිවේදනය කිරීම.**

18.1 පහත සඳහන් කර ඇති අවස්ථාවල දී ඡන්ද අපේක්ෂකයින් නිතරගයෙන් කාරක සභාවට තේරී පත් වී ඇති බව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් නිවේදනය කළ යුතුයි.

(අ) යම් නාම යෝජනා පත්‍රයක් සඳහා 17.2 (අ) නිලවරණ නියෝගය යටතේ විරෝධතා ලැබී තිබුණ ද , එවැනි විරෝධතා නොසලකමින් එම නාම යෝජනා පත්‍ර ද ඇතුළත්ව විරෝධතා භාරගත් දින පෙ.ව. 11.01 වන විට තමන් විසින් ප්‍රතික්ෂේප නොකළ නාම යෝජනා පත්‍ර 05 සිට 09 දක්වා අතර ප්‍රමාණයක් ඉතිරිව තිබෙන්නේ නම් , එම නාම යෝජනාවලට අදාළ ඡන්ද අපේක්ෂකයින් නිතරගයෙන් තේරී පත් වූ බව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා/සහකාර ඡන්ද නිලධාරියා විසින් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුයි.

18.2 18.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද අපේක්ෂකයින් නිතරගයෙන් තේරී පත් වූ බවට නිකුත් කරන නිවේදනය පිටපත් 02 කින් යුතුව සකස් කළ යුතුයි. එම නිවේදනය 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ඇතුළත්වන ජර්නලයේ i කොටසේ සඳහන්"ඇ"ආකෘතියට සාරානුකූල විය යුතුයි.

**කාරක සභාව සඳහා කාරක සභිකයින් තේරී පත් නොවූ බවට නිවේදනය කිරීම.**

19.1 පහත සඳහන් කර ඇති අවස්ථාවල දී ප්‍රාදේශිකයක් සඳහා කිසිදු ඡන්ද අපේක්ෂකයෙක් කාරක සභිකයෙක් ලෙසට තේරී පත් වී නැති බවට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් නිවේදනය කළ යුතුයි.

(අ) නාම යෝජනා භාරගත් දින පෙ.ව. 10.01 වන විට,

(I). කිසිදු නාම යෝජනා පත්‍රයක් භාර දී නැති අවස්ථාවක

(II). භාර දී ඇති නාම යෝජනා පත්‍ර සංඛ්‍යාව 04 ක් හෝ ඊට වඩා අඩු වූ අවස්ථාවක

(ආ) නාම යෝජනා භාරගත් දින පෙ.ව. 11.01 වන විට ,

(I). 17.2 (ආ), 17.2 (ඇ) හෝ 17.2 (ඈ) යන නිලවරණ නියෝගවලට අනුව මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම නිසා වලංගු නාම යෝජනා පත්‍ර සංඛ්‍යාව 05 කට වඩා අඩු වූ අවස්ථාවක

19.2 19.1 නිලවරණ නියෝගයට අනුව කාරක සභාව සඳහා කාරක සභිකයින් තේරී පත් නොවූ බවට නිකුත් කරන නිවේදනය පිටපත් 02 කින් යුතුව සකස් කළ යුතුයි. එම නිවේදනය 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ජර්නලයේ i කොටසේ සඳහන් "ඉ" ආකෘතියට සාරානුකූල විය යුතුයි.

20.1 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියෙකුට භාර දුන් නාම යෝජනා පත්‍රයක් ඉල්ලා අස්කර ගැනීමට කිසිම ඡන්ද අපේක්ෂකයෙකුට හෝ වෙනත් කිසිවෙකුට හෝ අයිතියක් නැත. *නාමයෝජනා භාරදුන් ඡන්ද අපේක්ෂකයෙකුගේ නාම යෝජනා පත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම.*

21.1 නාමයෝජනා භාරගත් දින පෙ.ව. 11.01 වන විට නාම යෝජනා පත්‍ර සඳහා 17.2 (අ) නිලවරණ නියෝගය යටතේ විරෝධතා ලැබී තිබුණද, එවැනි විරෝධතාවයන් සැලකිල්ලට නොගෙන එම නාම යෝජනා පත්‍ර ද සමග ප්‍රතික්ෂේප නොකරන ලද නාම යෝජනා පත්‍ර 09 කට වඩා වැඩි සංඛ්‍යාවක් තිබෙන විට එවැනි ඡන්ද මධ්‍යස්ථානයක් සඳහා ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමට ඡන්දයක් පැවැත්විය යුතු අතර ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ගත යුතුයි. *ඡන්ද අංක වෙන්කර ගැනීම.*

(අ) 21.1 නිලවරණ නියෝගයට අනුව ප්‍රතික්ෂේප නොකරන ලද නාම යෝජනා පත්‍රවලට අදාළ ඡන්ද අපේක්ෂකයින්ට ඡන්ද අංකයක් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ලබා දිය යුතුයි.

(ආ) කුසපත් ඇදීම මගින් එක් එක් ඡන්ද අපේක්ෂකයින්ට හිමි ඡන්ද අංක ලබාදිය යුතු අතර, ඡන්ද අපේක්ෂකයින්ගේ ප්‍රමාණයට සමාන අංක ප්‍රමාණයක් කුසපත් ඇදීම සඳහා යොදා ගැනීමෙන් මෙම ඡන්ද අංක ලබාදීමට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා /සහකාර ඡන්ද නිලධාරියා කටයුතු කළ යුතුයි.

21.2 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් එක් එක් ඡන්ද අපේක්ෂකයින්ගේ නම් හා ඔවුන්ට ලබාදුන් ඡන්ද අංක ඇතුළත් නිවේදනයක්, නාම යෝජනා භාරගත් දිනයේ දී ම ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබා දිය යුතුයි.

21.3 21.2 නිලවරණ නියෝගයට අනුව ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබාදිය යුතු ඡන්ද අපේක්ෂකයින්ගේ නම් හා ඔවුන්ගේ ඡන්ද අංක ඇතුළත් නිවේදනය පිටපත් 02 කින් යුතුව සකස්කළ යුතුයි. එම නිවේදනය 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ජර්නලයේ i කොටසේ සඳහන් "ඊ"ආකෘතියට සාරානුකූල විය යුතුයි.

## *VI* වන කොටස - ඡන්ද විමසීම

22.1 යම් ඡන්ද මධ්‍යස්ථානයක ඡන්දය විමසීමට නියමිත දිනයට අවම වශයෙන් දින 05 කටවත් පෙර ඡන්ද අපේක්ෂකයින්ගේ නම් හා ඔවුන්ගේ ඡන්ද අංක සහ ඡන්දය පවත්වන දින, වේලාවන්, නිලවරණ කටයුතු සිදුකරන ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ විස්තර ද ඇතුළත් ඡන්ද විමසීමට අදාළව ප්‍රසිද්ධ කළ යුතු දැන්වීමේ ආදර්ශයක්, සමග අවශ්‍ය කරන දැන්වීම් ප්‍රමාණය ද එම දැන්වීම මුද්‍රණය කර ලබාදිය යුතු අවසාන දිනය ද පිළිබඳව, ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සමිතියේ ලේකම් වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි. *ඡන්ද අපේක්ෂකයින්ගේ නම් හා ඡන්ද අංක ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.*

22.2 22.1 නිලවරණ නියෝගයට අනුව ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් තමාට භාරදුන් ඒ ඒ ප්‍රාදේශිකවල ඡන්ද අපේක්ෂකයින්ගේ නම්, ඔවුන්ට වෙන් කළ ඡන්ද අංක ඇතුළත් කරන ලද දැන්වීම් එක් එක් ප්‍රාදේශික සඳහා වෙන වෙනම මුද්‍රණය කර, ලබා දිය යුතු බවට නියම කර ඇති දැන්වීම් ප්‍රමාණය, නියමිත දිනයේ දී හෝ ඊට පෙර ප්‍රධාන ඡන්ද නිලධාරියාට ලබාදීම ලේකම්ගේ වගකීමකි.

22.3 22.2 නිලවරණ නියෝගයට අනුව ලේකම් විසින් ප්‍රධාන ඡන්ද නිලධාරි වෙත භාර දෙන දැන්වීම් ඡන්ද මධ්‍යස්ථානයේ, ප්‍රාදේශික බල ප්‍රදේශය තුළ පිහිටි ජනාකීර්ණ ස්ථානවල, ග්‍රාම නිලධාරි කාර්යාලවල හා ග්‍රාමීය බැංකු ශාඛාවල ද ප්‍රදර්ශනය කළ යුතු බවට නියම කරමින් ප්‍රධාන ඡන්ද නිලධාරි විසින් සාමාන්‍යාධිකාරිට ලිඛිතව භාරදිය යුතුයි. එකී දැන්වීම් නියමිත ස්ථානවල නියමිත කාලය තුළ ප්‍රදර්ශනය කිරීමේ හා එවැනි ස්ථානවල එම දැන්වීම ප්‍රදර්ශනය කළ බවට තහවුරු කරන ලිඛිත සාක්ෂි ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාරදීමේ සම්පූර්ණ වගකීම සාමාන්‍යාධිකාරී වෙත පැවරේ.

22.4 22.3 නිලවරණ නියෝගයට අනුව ප්‍රදර්ශනය කරන දැන්වීම් අවම වශයෙන් ඡන්දය විමසීමට නියමිත දිනට දින 03 කටවත් කලින් සිට ප්‍රදර්ශනය කරවීමට අවශ්‍ය විධිවිධාන යෙදවීම හා එම දැන්වීම් නියමිත ස්ථානවල නියමිත කාලය තුළ ප්‍රදර්ශනය කරන බවට තහවුරුකර ගැනීම ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ වගකීමකි.

නාම යෝජනා භාරදුන් ඡන්ද අපේක්ෂකයෙකු මිය යාම.

23.1 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියෙකු / සහකාර ඡන්ද නිලධාරියෙකු විසින් 21.1 නිලවරණ නියෝගයට අනුව ඡන්ද අංකයක් ඡන්ද අපේක්ෂකයෙකුට / අපේක්ෂකයින්ට නිකුත් කළ අවස්ථාවත්, ඡන්දය විමසීම ආරම්භ කරන අවස්ථාවත් අතර කාලය තුළ යම් ඡන්ද අපේක්ෂකයෙකු / අපේක්ෂකයන් මරණයට පත් වුවහොත් සහ ඒ මරණය / මරණ සිදු වූ බවට ප්‍රධාන ඡන්ද නිලධාරියාට නිශ්චිතවම තහවුරු වන සාක්ෂි ලැබී තිබුනහොත් පමණක් , ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ගයක් ගැනීම නීත්‍යානුකුල වන්නේය.

(අ). මියගිය ඡන්ද අපේක්ෂකයාගේ නම /අපේක්ෂකයන්ගේ නම් ඡන්ද අපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට ද, එම ඉවත්කිරීම පිළිබඳව ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රකටව දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කිරීමට ද කටයුතු කිරීම.

*සහ*

(ආ). ඉහත (අ) ඡේදයට අනුව කටයුතු කිරීම නිසා ඡන්ද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 05 සිට 09 දක්වා අතර ප්‍රමාණයකට අඩු වී ඇත්නම් ඡන්දය විමසීම අවලංගු කර ඉතිරි වී ඇති ඡන්ද අපේක්ෂකයින් නිතරගයෙන් පත් වූ ලෙස ප්‍රකාශ කිරීම.

*හෝ*

(ඇ). ඉහත (අ) ඡේදයට අනුව කටයුතු කිරීම නිසා ඡන්ද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 05 ට වඩා අඩු වී ඇත්නම් ඡන්දය විමසීම අවලංගු කර එවැනි ප්‍රාදේශිකයක් සඳහා කිසිදු ඡන්ද අපේක්ෂකයෙක් කාරක සභිකයෙක් ලෙසට තේරී පත් වී නැති බවට ප්‍රකාශ කිරීම.

*හෝ*

(ඈ). ඉහත (අ) ඡේදයට අනුව කටයුතු කිරීමෙන් පසුව ද තවදුරටත් ඡන්ද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ වන විට ඡන්දය විමසීමේ කටයුතු නියමිත පරිදි කරගෙන යාම.

ඡන්ද මධ්‍යස්ථානයට ලබා දිය යුතු පහසුකම්

24.1 කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් ඡන්දය විමසීමේ කටයුතු කිරීමට එක් ඡන්ද මධ්‍යස්ථානයක් සඳහා මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියෙකු හා ඔහුගේ සහායට අවශ්‍ය වන සහකාර ඡන්ද නිලධාරීන් සංඛ්‍යාවක් පත්කළ යුතුයි. තම ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය විමසීමේ කටයුතු සාර්ථකව නිම කිරීම පිළිබඳ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාටයි.

24.2 ඡන්දය විමසීම සිදු කරන දිනයේ දී ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද විමසීමේ කාර්යයන් සඳහා ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින්;

(අ). ඡන්ද මධ්‍යස්ථානයකට අදාළ ඡන්ද නාම ලේඛනයක සඳහන් වන සාමාජික සංඛ්‍යාවට අනුව ඡන්දය විමසීමේ කටයුතු සඳහා අවශ්‍ය වන බවට තමන් නිශ්චය කරන ලද 12.1 නිලවරණ නියෝගයේ සඳහන් වන ලිපිද්‍රව්‍ය හා උපකරණ ප්‍රමාණය ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර අදාළ මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට / සහකාර ඡන්ද නිලධාරියාට භාරදිය යුතුයි.

(ආ). ඡන්ද විමසීම ඵලදායි ලෙස පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය බවට තමන් විසින් නිශ්චය කරන ලද 12.4 නිලවරණ නියෝගයේ සඳහන් වන සමිතියේ කාර්ය මණ්ඩලය, වාහන, ලී බඩු හා උපකරණ ප්‍රමාණවත් පරිදි ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවලට ලබාදීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගත යුතුයි.

(ඇ). ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවලට සමිතියෙන් පත්කළ යුතු කාර්ය මණ්ඩල ප්‍රමාණය නිශ්චය කොට ලබා ගැනීමෙන් පසුව එම කාර්ය මණ්ඩලය ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීමට අවශ්‍ය පත්වීම් ලිපි ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් නිකුත්කළ යුතුයි.

(ඈ). මෙම නිලවරණ නියෝග මාලාවෙන් තමන්ට පැවරී ඇති බලතල ප්‍රකාරව ඡන්ද විමසීම ඵලදායි ලෙස පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන ඕනෑම ක්‍රියාවක් කළ යුතුයි.

25.1 ඡන්දය විමසීම සිදු කරන දිනයේදී ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද විමසීමේ කාර්යන් වඩාත් විනිවිදභාවයකින් හා නීත්‍යානුකූලව පැවැත්වීම සහතික කිරීම සඳහා මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියෙකු / සහකාර ඡන්ද නිලධාරියෙකු විසින්; ඡන්ද මධ්‍යස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම් හා ඡන්ද මධ්‍යස්ථානයට ලබාගත යුතු දෑ

(අ). මෙම නිලවරණ නියෝග මාලාවේ 11.3, 16.3, 22.3, හා 23.1 (අ) යන නිලවරණ නියෝගවල සඳහන් කර ඇති දැන්වීම් 44.1 හා 44.2 යන නිලවරණ නියෝගවලට අනුකූලව ප්‍රදර්ශනය කර ඇති බව තහවුරු කර ගැනීම හෝ / සහ ප්‍රදර්ශනය කිරීමට හෝ අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුයි.

(ආ). ඡන්ද මධ්‍යස්ථානයට පැමිණීමට පෙර ඡන්දය විමසීමට අවශ්‍ය වන සියලුම ලිපිද්‍රව්‍ය, ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි, ඡන්ද කුටි ආවරණ, උපකරණ, කාර්ය මණ්ඩලය හා දැන්වීම් ප්‍රමාණවත් වන පරිදි ප්‍රධාන ඡන්ද නිලධාරියාගෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.

(ඇ). මෙම නිලවරණ නියෝග මාලාවෙන් තමන්ට පැවරී ඇති බලතල ප්‍රකාරව ඉටුකළයුතු ඕනෑම ක්‍රියාවක් කළ යුතුයි.

26.1 සෑම ඡන්ද පත්‍රිකාවක්ම මෙම නිලවරණ නියෝග මාලාවේ පස්වන උපලේඛනයේ දක්වා ඇති "අ"ආකෘතියට සාරානුකූල විය යුතුයි. ඡන්ද පත්‍රිකාවක ඇතුළත් විය යුතු කරුණු

26.2 ඒ සෑම ඡන්ද පත්‍රිකාවකම මුහුණත අංකයක් මුද්‍රණය කර තිබිය යුතු අතර, එම අංකය ම ඒ ඡන්ද පත්‍රිකාවට අදාල වන උප පත්‍රිකාවේද මුද්‍රණය කර තිබිය යුතුයි.

26.3 සෑම ඡන්ද පත්‍රිකාවකම ඒ ඡන්ද මධ්‍යස්ථානයේ සියලුම ඡන්ද අපේක්ෂකයින්ගේ ඡන්ද අංක ඇතුළත් වන පරිදි මුද්‍රණය කර තිබිය යුතුයි.

27.1 ඡන්දය විමසන දිනයේ පෙරවරු 8.00 සිට ඡන්ද විමසීම අවසාන වන තුරු ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය තුළට පැමිණීමට හා රැඳී සිටීමට බලය ඇත්තේ පහත සඳහන් කර ඇති අයට පමණී. වෙනත් කිසිදු පුද්ගලයෙකුට ඉහත සඳහන් කර ඇති කාලය තුළ ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය තුළට පැමිණීමට හෝ රැඳීසිටීමට හෝ අවසර නැත. එවැනි අනවසර පුද්ගලයන් පැමිණියහොත් ඔවුන් වහාම ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රයෙන් ඉවත් කිරීමට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරින් කටයුතු කළ යුතුයි. ඡන්ද මධ්‍යස්ථානයකට පැමිණීමට සහ ඡන්ද මධ්‍යස්ථානය තුළ රැඳී සිටීමට බලය ඇති අය

(අ) කොමසාරිස්වරයාට

(ආ). කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට

(ඇ). ප්‍රධාන ඡන්ද නිලධාරියාට, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට, ඡන්ද නිලධාරින්ට, සහකාර ඡන්ද නිලධාරින්ට

(ඈ). ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් අදාල ඡන්ද මධ්‍යස්ථානයේ රාජකාරී සඳහා ලිපියකින් අනුයුක්ත කරන ලද සමිතියේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට

(ඉ). මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ අවසරය ඇතිව ඡන්ද මධ්‍යස්ථානයට අදාල ප්‍රාදේශිකයේ / මිනි කෝප් සිටියේ / කෝප් සිටියේ කළමනාකරුට හා එහි සේවකයෙකුට

(ඊ). ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද අපේක්ෂකයින්ට, ඔවුන්ගේ නම් යෝජනා කරන ලද හා ස්ථිර කරන ලද සාමාජිකයින්ට

(උ). නිලවරණ කටයුතු සඳහා අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරින්ට

(ඌ). ඡන්දය ප්‍රකාශ කරන තුරු ඡන්දදායකයින්ට

(එ). ඡන්දදායකයා ඡන්දය ප්‍රකාශ කරන තුරු ශාරීරික දුබලතාවයක් නිසා තනිවම පැමිණීමට නොහැකි ඡන්දදායකයෙකු රැගෙන ආ අයෙකුට

(ඒ). ඡන්ද මධ්‍යස්ථානයට නිලධාරින් ප්‍රවාහනය කළ රථවාහනවල රියදුරන්ට/ රිය සහායකයින්ට

ඡන්දය විමසන කාලය

28.1 පහත සඳහන් කර ඇති පරිදි ඡන්දය විමසීම ආරම්භ කිරීම හා අවසන් කිරීම සිදුකළ යුතුයි.

(අ). ඡන්දය විමසන බවට නියම කර ඇති දිනයේ ඡන්දය විමසීම පෙරවරු 9.00 ට ආරම්භ කළ යුතු අතර, එදිනම පස්වරු 4.00 ට ඡන්දය විමසීම අවසන් කළ යුතුයි.

(ආ). ඉහත (අ) ඡේදයේ සඳහන් කර ඇති නියමිත වේලාවටම ඡන්දය විමසීමේ කටයුතු ආරම්භ කිරීමටත්, නියමිත වේලාවටම ඡන්දය විමසීමේ කටයුතු අවසන් කිරීමටත්, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරීන් කටයුතු කළ යුතුයි.

ඡන්ද පෙට්ටිවලට මුද්‍රා තැබීම සහ ඡන්දය විමසීම ආරම්භ කිරීම

29.1 ඡන්දය විමසීම ආරම්භ කිරීමට පෙර ඡන්ද මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ;

(අ). ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීමට සූදානම් වන අවස්ථාවේදී ඡන්ද දායකයෙකු, ඡන්ද අපේක්ෂකයින්, එම ඡන්ද අපේක්ෂකයින්ගේ යෝජනාකරුවන් හා ස්ථිරකරුවන් ඡන්ද මධ්‍යස්ථානයට පැමිණ සිටියේ නම් ඔවුන්ට ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්වීමෙන් අනතුරුව පෙ.ව. 9.00 ට පෙර ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබිය යුතුයි.

(ආ). ඡන්ද පෙට්ටිය මුද්‍රා තබන අවස්ථාවේදී ඉහත (අ) ඡේදයේ සඳහන් කිසිවෙක් ඡන්ද මධ්‍යස්ථානයට පැමිණ නොසිටියද, ඒ පිළිබඳව නොසලකා පෙ.ව. 9.00 ට පෙර ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබිය යුතුයි.

ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම

30.1 33.1 නිලවරණ නියෝගයට යටත්ව එක් ඡන්දදායකයෙකුට ලබා දිය යුත්තේ එක් ඡන්ද පත්‍රිකාවක් පමණී.

30.2 8.2 නිලවරණ නියෝගයට අනුව සකස් කරන ලද ඡන්ද නාම ලේඛනයේ ඡන්ද දායකයෙක් ලෙසට නම සඳහන් වන ඕනෑම අයෙකුට, පහත සඳහන් කර ඇති වලංගු හැඳුනුම්පත් වලින් එකක් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට/සහකාර ඡන්ද නිලධාරියාට ඉදිරිපත් කර ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීමට අයිතියක් ඇත. එහෙත් ඡායාරූපය හඳුනාගැනීමට නොහැකි හා/හෝ සඳහන් කර ඇති කරුණු කියවීමට නොහැකි තරම් අපැහැදිලි තත්ත්වයේ ඇති හැඳුනුම්පතක් ඉදිරිපත් කරන අයට ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීමට අයිතියක් නැත.

(අ). ජාතික හැඳුනුම්පත

(ආ). වලංගු රියදුරු බලපත්‍රය

(ඇ). වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඈ). විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් නිකුත් කළ විශ්‍රාමික හැඳුනුම්පත

(ඉ). ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කළ වැඩිහිටි හැඳුනුම්පත

(ඊ). ආගමික කටයුතු භාර අමාත්‍යාංශයකින් හෝ ආගමික කටයුතු භාර රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ භික්ෂුන්වහන්සේලාට / පූජකතුමන්ලාට නිකුත් කළ වලංගු හැඳුනුම්පතක්

30.3 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන සහකාර ඡන්ද නිලධාරියෙකු හෝ විසින් තමා වෙත පැමිණෙන ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ යුතුයි. එහෙත් එසේ ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායකයෙකුට නිකුත් කිරීමට පළමු ;

(අ) මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් 30.2 නිලවරණ නියෝගයේ සඳහන් වන හැඳුනුම්පතක් ඡන්දදායකයාගෙන් ලබාගෙන, එකී හැඳුනුම්පතේ හා ඡන්ද නාම ලේඛනයේ සඳහන් වන ඡන්දදායකයාගේ නම සමාන වන්නේද යන්න තහවුරු කරගත යුතුයි.

(ආ) ඉහත (අ) ඡේදයට අනුව කටයුතු කිරීමෙන් පසු මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා/සහකාර ඡන්ද නිලධාරියා විසින් තමන්ට භාර දී ඇති ඡන්ද නාම ලේඛනයේ සඳහන් වන ඡන්දදායකයාගේ නම හා සාමාජික අංකය හඬ නගා කියවිය යුතුයි.

(ඇ) ඉහත (ආ) ඡේදයට අනුව කටයුතු කිරීමේදී යම් ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවයක් ඡන්ද අපේක්ෂකයෙකුගෙන්/ඡන්ද අපේක්ෂකයෙකුගේ නමක් යෝජනා කළ හෝ ස්ථිර කළ හෝ අයෙකුගෙන් ඉදිරිපත් වූ විට විරෝධතාවය එල්ල වූ ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාවක් ලබා දිය යුතු ද, නැද්ද යන්න මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා විසින් තීරණය කළ යුතුයි.

(ඈ) ඡන්ද පත්‍රිකාවක තැබිය යුත්තේ මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ හෝ සහකාර ඡන්ද නිලධාරියෙකුගේ මුද්‍රාවක් ද, නැතහොත් වෙනත් මුද්‍රාවක් ද යන්න පිළිබඳව මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා විසින් තීරණය කර, ඒ අනුව ඡන්දදායකයින්ට නිකුත් කරන සියලුම ඡන්ද පත්‍රිකාවල එම මුද්‍රාව තැබිය යුතුයි.

(ඉ) මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා/සහකාර ඡන්ද නිලධාරියා විසින් ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කර ඇති බව පහසුවෙන් හඳුනා ගැනීම සඳහා ඡන්ද නාම ලේඛනයේ ඡන්ද පත්‍රිකාව නිකුත් කරන ලද ඡන්දදායකයාගේ නම ඉදිරියෙන් ලකුණක් තැබිය යුතුයි. (උදා :- -)

31.1 30.3 නිලවරණ නියෝගයට අනුව තමන්ට ලබාදුන් ඡන්ද පත්‍රිකාව ද රැගෙන ඡන්දය සලකුණු කිරීම සඳහා වෙන් කරන ලද ආවරණ කුටියට ගොස් කිසිවෙකුට නොපෙනෙන අයුරින් 31.2 හා 31.3 යන නිලවරණ නියෝගවලට අනුකූලව තම ඡන්දය රහසින් සලකුණු කිරීමට ඡන්දදායකයා විසින් කටයුතු කළ හැකිය. ඡන්දදායකයෙකු විසින් ඡන්දය දිය යුතු ආකාරය

31.2 තමන්ට ලබා දී ඇති ඡන්ද පත්‍රිකාවේ එක් ඡන්ද අපේක්ෂකයෙකුට එක් ඡන්දයක් බැගින් උපරිම වශයෙන් ඡන්ද අපේක්ෂකයින් 09 දෙනෙකුට ඡන්ද 09 ක් සලකුණු කිරීමට ඡන්දදායකයෙකුට අයිතියක් ඇත.

31.3 තමන්ට ලබා දී ඇති ඡන්ද පත්‍රිකාවේ සඳහන් ඡන්ද අපේක්ෂකයින්ගේ ඡන්ද අංකය ඉදිරියේ ඇති කොටුව මත කතිර ලකුණක් (උදා:- X ) යෙදීමෙන් ඡන්දදායකයෙකු විසින් තම ඡන්දය පාවිච්චි කළ හැකිය.

31.4 ඡන්දදායකයා විසින් තම ඡන්දය සලකුණු කළ වහාම, තමාගේ ඡන්දය සලකුණු කර ඇති ආකාරය කිසිවෙකුට නොපෙනෙන ලෙසට ඡන්ද පත්‍රිකාව නවා මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා ඉදිරිපිට ඇති ඡන්ද පෙට්ටිය තුළට ඡන්ද පත්‍රිකාව දමා නොපමාවම ඡන්ද මධ්‍යස්ථානයෙන් බැහැර විය යුතුයි.

32.1 පහත සඳහන් කර ඇති පරිදි ඡන්දදායකයෙකුට ඡන්දය සලකුණු කළ යුතු ආකාරය පැහැදිලි කර දිය යුතුයි ; ඡන්දදායකයෙකුට ඡන්දය සලකුණු කිරීම සඳහා සහාය වීම

(අ) ඡන්දය සලකුණු කළ යුතු ආකාරය පැහැදිලි කර දෙන ලෙසට යම් ඡන්දදායකයෙකු විසින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගෙන්/සහකාර ඡන්ද නිලධාරියාගෙන් ඉල්ලා සිටින විට, එම නිලධාරීන් විසින් ඡන්දය සලකුණු කළ යුතු ආකාරය සියලු දෙනාටම ඇසෙන ලෙස එම ඡන්දදායකයාට පැහැදිලි කර දිය හැක.

(ආ) එහෙත් ඒ අයුරින් ඡන්දදායකයෙකුට කරනු ලබන පැහැදිලි කිරීම් නිසා කිසිදු ඡන්ද අපේක්ෂකයෙකුට ඡන්දය දෙන ලෙසට හෝ නොදෙන ලෙසට හෝ ඡන්ද දායකයාට ඍජුව හෝ වක්‍රව තේරුම් යන ආකාරයේ කිසිදු උපදෙසක් නැතහොත් මගපෙන්වීමක් ලබාදීමෙන් වැලැකීසිටීමට ඡන්ද මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා/සහකාර ඡන්ද නිලධාරියා තරයේ සිහිතබා ගත යුතුයි.

32.2 අන්ධභාවය නිසා හෝ වෙනත් ශාරීරික දුබලතාවයක් නිසා හෝ යම් ඡන්දදායකයෙකුට තම ඡන්දය තමන්ටම සලකුණු කර ගැනීමට නොහැකි වන අවස්ථාවකදී මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා විසින් සහකාර ඡන්ද නිලධාරියෙකු ඉදිරිපිටදී ඡන්දදායකයා පවසන ආකාරයටම ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව සලකුණු කළ යුතු අතර, එසේ සලකුණු කිරීමෙන් පසු ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටියට බහාලීමට ද කටයුතු කළ යුතුයි.

32.3 32.2 නිලවරණ නියෝගයට අනුවම හැර වෙනත් කිසිදු අවස්ථාවක දී ඡන්දදායකයෙකුගේ ඡන්දය වෙනත් කිසිවෙකුට සලකුණු කිරීමට හෝ ඡන්දදායකයා ඡන්දය සලකුණු කරන විට වෙනත් කිසිදු පුද්ගලයෙකුට ඡන්දය සලකුණු කරන ස්ථානයේ රැඳී සිටීමට හෝ මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ඉඩ නොදිය යුතුයි.

**නරක් වූ ඡන්ද පත්‍රිකා**

33.1 ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා තමන්ට භාර දුන් ඡන්ද පත්‍රිකාව අනවධානයෙන් පරිහරණය කිරීම නිසා වලංගු ඡන්ද පත්‍රිකාවක් ලෙස භාවිතා කිරීමට නොහැකි තත්වයකට පත් වී ඇති අවස්ථාවක දී, අනවධානයෙන් පරිහරණය කළ ඡන්ද පත්‍රිකාව මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියාට භාර දී නව ඡන්ද පත්‍රිකාවක් ලබාදෙන ලෙසට ඡන්දදායකයා විසින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගෙන් ඉල්ලා සිටිය යුතුයි. එවැනි අවස්ථාවක දී මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ අභිමතය පරිදි නව ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායකයාට නිකුත් කළ හැක.

33.2 33.1 නිලවරණ නියෝගයට අනුව නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරන විටම, මින් අනතුරුව මෙම නිලවරණ නියෝග මාලාවේ නරක් වූ ඡන්ද පත්‍රිකාවක් ලෙස හඳුන්වන ඡන්ද දායකයා විසින් තමන් වෙත භාර දී ඇති අනවධානයෙන් පරිහරණය කළ ඡන්ද පත්‍රිකාව අවලංගු කර එය තමන්ගේ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුයි. නරක් වූ ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටියට නොදැමිය යුතුයි.

33.3 ඡන්දදායකයෙකුට නරක් වූ ඡන්ද පත්‍රිකාවක් ඉදිරිපත් කර නව ඡන්ද පත්‍රිකාවක් ලබා ගත හැක්කේ එක් වරක් පමණි.

**ඡන්දය විමසීම අවසන් කිරීම**

34.1 ඡන්දය විමසීම අවසන් කිරීම සඳහා නියම කර ඇති පස්වරු 4.00න් පසු කිසිම ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් ලබා නොදිය යුතුයි. එහෙත් පස්වරු 4.00 ට හෝ ඊට පෙර හෝ ඡන්ද පත්‍රිකා ලබා දී ඇති ඡන්ද මධ්‍යස්ථානය තුළ රැඳී සිටින සියලුම ඡන්දදායකයින්ට තම ඡන්දය පාවිච්චි කිරීමට මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා විසින් අවසර ලබා දිය යුතුයි.

34.2 34.1 නිලවරණ නියෝගයට අනුව සියලුම ඡන්දදායකයින් ඡන්දය දී අවසාන වූ වහාම මෙම නිලවරණ නියෝග මාලාවේ හයවන උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූලව ඡන්ද පත්‍රිකා ගිණුමක් මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා විසින් සකස් කළ යුතුයි.

## *VII කොටස - ඡන්ද ගණන් කිරීම*

**ඡන්දය ගණන් කරන ස්ථානය**

35.1 ඡන්දය විමසීමට අදාළ ඡන්ද ගණන් කිරීම කළ යුත්තේ ඡන්දය විමසන ලද ඡන්ද මධ්‍යස්ථානය තුළදීමයි.

**ඡන්දය ගණන් කරන ස්ථානයට පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තන්**

36.1 34.2 නිලවරණ නියෝගයට අනුව ඡන්ද විමසීම අවසාන වූ අවස්ථාවේ සිට ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන තුරු ඡන්ද මධ්‍යස්ථානයන් තුළට පැමිණීමට හා රැඳී සිටීමට බලය ඇත්තේ පහත සඳහන් කර ඇති තැනැත්තන්හට පමණි. ඊට පරිබාහිර වෙනත් කිසිදු පුද්ගලයෙකුට ඉහත සඳහන් කාලය තුළ ඡන්ද මධ්‍යස්ථානයක් ඇතුළට පැමිණීමට හෝ රැඳී සිටීමට හෝ අවසර නැත. ඉහත සඳහන් කාලය තුළ අනවසර පුද්ගලයන් ඡන්ද මධ්‍යස්ථානය තුළට පැමිණියහොත් හෝ/සහ රැඳී සිටියහොත් ඔවුන් වහාම ඡන්ද මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීමට මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා/සහකාර ඡන්ද නිලධාරියා කටයුතු කළ යුතුයි;

(අ) කොමසාරිස්වරයාට,

(ආ) කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට,

(ඈ) ප්‍රධාන ඡන්ද නිලධාරියාට, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට, ඡන්ද නිලධාරීන්ට, සහකාර ඡන්ද නිලධාරීන්ට,

(ඈ) ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ රාජකාරී සඳහා ලිපියකින් අනුයුක්ත කරන ලද සමිතියේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට,

(ඉ) මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ අවසරය ඇතිව ඡන්ද මධ්‍යස්ථානයට අදාළ ප්‍රාදේශිකයේ /මිනි කෝප් සිටියේ/කෝප් සිටියේ කළමනාකරුට හා එහි සේවකයෙකුට,

(ඊ) ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද අපේක්ෂකයින්ට, ඔවුන්ගේ නම් යෝජනා කරන ලද හා ස්ථිර කරන ලද සාමාජිකයින්ට,

(උ) නිලවරණ කටයුතු සඳහා අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරීන්ට.

37.1 34.2 නිලවරණ නියෝගයට අනුව ඡන්ද පත්‍රිකා ගිණුම සකස් කර එහි නිරවද්‍යතාවය තහවුරු කරගත් වහාම ඡන්ද පෙට්ටියේ/පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ කටයුතු ආරම්භ කළ යුතුයි. ඡන්ද පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීම

37.2 ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් එක් එක් ඡන්ද අපේක්ෂකයන් ලැබූ ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීමට පළමු ;

(අ) ඡන්ද මධ්‍යස්ථානයේ එක් ඡන්ද පෙට්ටියක් පමණක් තිබෙන විට, ඒ එක් එක් ඡන්ද පෙට්ටි විවෘත කොට ඒ තුළ ඇති සියලුම ඡන්ද පත්‍රිකා ඉවතට ගත යුතුයි. අනතුරුව එසේ ඉවතට ගත් ඡන්ද පත්‍රිකා සියල්ල ගණන් කළ යුතුය;

(ආ) ඡන්ද මධ්‍යස්ථානයේ එක් ඡන්ද පෙට්ටියකට වඩා ඡන්ද පෙට්ටි සංඛ්‍යාවක් තිබෙන විට, ඒ ඒ ඡන්ද පෙට්ටි විවෘත කොට ඒ තුළ ඇති සියලුම ඡන්ද පත්‍රිකා ඉවතට ගත යුතුයි. අනතුරුව එසේ ඉවතට ගත් ඡන්ද පත්‍රිකා සියල්ල ගණන් කළ යුතුයි;

(ඇ) ඒ අනුව ගණන් කිරීමෙන් ලැබෙන ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව, 34.2 නිලවරණ නියෝගයට අනුව සකස් කළ ඡන්ද පත්‍රිකා ගිණුමේ සඳහන් වන ඡන්දදායකයින්ට නිකුත් කළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාවට සමාන වන බවට තහවුරු කරගත යුතුයි;

(ඈ) යම් හෙයකින් ඉහත (ඇ) ඡේදයට අනුව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමාන නොවන්නේනම්, සියලුම ඡන්ද පත්‍රිකා නැවත වරක් ගණන් කළ යුතුයි;

(ඉ) ඡන්ද පෙට්ටියේ/පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ දී අවස්ථා 02ක දී එකම පිළිතුරක් ලැබුණහොත්, ඡන්ද පත්‍රිකා ගිණුමේ සඳහන් කර ඇති වටිනාකම් නොසලකා ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ දී ලැබුණ පිළිතුර නිවැරදි ලෙස සලකා කටයුතු කළ යුතුයි.

38.1 ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් පහත සඳහන් කර ඇති ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කළ යුතුයි. යම් ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් තීරණය කළ විට එම තීරණය අවසානාත්මක වේ; ප්‍රතික්ෂේප කළයුතු ඡන්ද පත්‍රිකා

(අ) කිසිඳු ඡන්දයක් ප්‍රකාශ නොකළ ඡන්ද පත්‍රිකාවක්,

(ආ) ඡන්ද අපේක්ෂකයන් 09 දෙනෙකුට වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කර ඇති ඡන්ද පත්‍රිකාවක්,

(ඇ) ඡන්ද දායකයා තබා ඇති සලකුණ අනුව ඡන්දය ප්‍රකාශ කර ඇත්තේ කවර ඡන්ද අපේක්ෂකයෙකුට ද යන්න අවිනිශ්චිත වූ ඡන්ද පත්‍රිකාවක්,

(ඈ) ව්‍යාජ හෝ කූට ඡන්ද පත්‍රිකාවක් බවට ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් නිශ්චය කරන ලද ඡන්ද පත්‍රිකාවක්,

(ඉ) විරූප කරන ලද ඡන්ද පත්‍රිකාවක්,

(ඊ) ඉහත සඳහන් නොවන වෙනත් කරුණක් මත ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතු බවට තීරණය කරන ලද ඡන්ද පත්‍රිකාවක්.

38.2 ඡන්ද අපේක්ෂකයින් , ඡන්ද අපේක්ෂකයින්ව යෝජනා කළ හා ස්ථිර කළ අය ඡන්ද මධ්‍යස්ථානය තුළ සිටි නම් ඔවුන්ට ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකාව පෙන්විය යුතු අතර, ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කිරීමට හේතුව ද ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් ප්‍රකාශ කළ යුතුයි.

38.3 යම් ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ වහාම එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවේ මුහුණත පැහැදිලිව **ප්‍රතික්ෂේප කරන ලදී** යන වචන ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් සටහන් කොට ස්වකීය අත්සන ද තැබිය යුතුයි.

38.4 ප්‍රතික්ෂේප කරන ලද සියලුම ඡන්ද පත්‍රිකා ප්‍රධාන ඡන්ද නිලධාරියාට භාර දෙන තුරු ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් තමා භාරයේ සුරක්ෂිතව තබාගත යුතුයි.

එක් එක් ඡන්ද අපේක්ෂකයින් ලබාගත් ඡන්ද ප්‍රමාණය ගණන් කිරීම

39.1 37.2 (ඇ) හෝ 37 (2) (ඉ) හෝ නිලවරණ නියෝගයට අනුව ඡන්ද පෙට්ටියේ / පෙට්ටිවල තිබූ නිවැරදි ඡන්ද පත්‍රිකා ගණන තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම ඡන්ද පත්‍රිකාවලින් 38.1 නිලවරණ නියෝගයට අනුව ප්‍රතික්ෂේප කළයුතු ඡන්ද පත්‍රිකා හා මින් අනතුරුව වලංගු ඡන්ද පත්‍රිකා යනුවෙන් හඳුන්වන ගණන් කිරීම සඳහා වලංගු වන ඡන්ද පත්‍රිකා වෙන්කර ගත යුතුයි.

39.2 ඉන්පසු ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් සියලුම වලංගු ඡන්ද පත්‍රිකා වලින් එක් එක් ඡන්ද අපේක්ෂකයින් ලබාගෙන තිබූ ඡන්ද ප්‍රමාණය වෙන වෙනම ඡන්දය සලකුණු කරන ආකෘති පත්‍රයේ ඒ ඒ ඡන්ද අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඇල ඉරක් [(/) හෝ (\)] ලෙසට නිල් හෝ කළු හෝ පාටින් සටහන් කළ යුතුයි.

(අ). මේ අනුව සියලුම වලංගු ඡන්ද පත්‍රිකාවලින් ලැබුණු ඡන්ද ප්‍රමාණය සටහන් කිරීමෙන් අනතුරුව, ඒ ඒ ඡන්ද අපේක්ෂකයින්ට ලැබී තිබූ මුළු ඡන්ද ප්‍රමාණය එකතු කොට එම එකතුව ඒ ඒ ඡන්ද අපේක්ෂකයින්ගේ නම් ඉදිරියෙන් සටහන් කළ යුතුයි.

(ආ). ඉන් අනතුරුව වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් ඡන්ද අපේක්ෂකයාගේ නම නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනයේ මුලට ද, අඩුම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් ඡන්ද අපේක්ෂකයාගේ නම අවසානයට ද එන ලෙසට, ඒ ඒ ඡන්ද අපේක්ෂකයින් ඡන්ද ලබාගත් සංඛ්‍යාවේ අනුපිළිවෙලට නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනයක් ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් සකස් කළ යුතුයි.

39.3 39.2(ආ) නිලවරණ නියෝග සඳහන් වන ආකාරයට වෙනස් ලෙසකින් ඡන්ද ලැබී ඇති විටක ඡන්ද අපේක්ෂකයින්ගේ අනුපිළිවෙල තීරණය කිරීම සඳහා ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් පහත සඳහන් කර ඇති පරිදි කටයුතු කළ යුතුයි.

(අ). පහත සඳහන් කර ඇති අවස්ථාවලදී ඡන්ද අපේක්ෂකයින්ගේ අනු පිළිවෙල තීරණය කළ යුත්තේ කුසපත් ඇදීමෙනි.

(I) සියලුම ඡන්ද අපේක්ෂකයින්ට එකම ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති විට ඒ සියලුම ඡන්ද අපේක්ෂකයින් සඳහා,

(II) එකම ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති ඡන්ද අපේක්ෂකයින් 02 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින විට අදාළ ඡන්ද අපේක්ෂකයින් සඳහා.

(ආ). කිසිදු ඡන්ද අපේක්ෂකයෙකුට එක ඡන්දයක්වත් ලැබී නැති අවස්ථාවකදී ඒ ඒ ඡන්ද අපේක්ෂකයින්ට ලබා දී තිබූ ඡන්ද අංක, ඡන්ද අපේක්ෂකයින්ගේ අනුපිළිවෙල තීරණය කිරීමට යොදා ගත යුතුයි.

39.4 ඡන්ද ගණන් කිරීමේ නිලධාරියෙකු සතු යම් බලයක් හෝ කාර්යයක්, ඒ නිලධාරියාගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ ක්‍රියාකරන සහකාර ඡන්ද නිලධාරියෙකුට පවරා ඔවුන් ලවා එය ඉටු කරවා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

39.5 යම් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳව මෙන්ම ඡන්ද ගණන් කිරීමේදී පැන නගින ඕනෑම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් දෙනු ලබන තීරණය තීරණාත්මක විය යුතු අතර, අවසානාත්මක ද වේ.

*එක් එක් ඡන්ද අපේක්ෂකයින් ලැබූ ඡන්ද නැවත ගණන් කිරීම*

40.1 39.2 (ආ) හෝ 39.3 යන නිලවරණ නියෝගවලට අනුව නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනය සකස් කර අත්සන් කිරීමට පෙර නැවත ඡන්දය ගණන් කරන ලෙසට ඡන්ද ගණන් කිරීමේ නිලධාරියාගෙන් ඉල්ලා සිටීමට මධ්‍යස්ථානය තුළ ඒ අවස්ථාවේදී සිටින ඕනෑම ඡන්ද අපේක්ෂකයෙකුට, ඡන්ද අපේක්ෂකයින්ව යෝජනා කළ හෝ ස්ථිර කළ අයෙකුට හෝ පමණක් අයිතියක් ඇත.

40.2 එහෙත් 40.1 නිලවරණ නියෝගයට අනුව යම් ඡන්ද මධ්‍යස්ථානයක නැවත ඡන්ද ගණන් කරන ලෙසට ඉල්ලා සිටිය හැක්කේ එක් වරක් පමණක් වන අතර, අදාල ඉල්ලීම ඡන්ද ගණන් කිරීමේ නිලධාරියාට ලිඛිතව යොමු කළ යුතුයි.

40.3 ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් නැවත ඡන්දය ගණන් කිරීමකදී, ඡන්ද සළකුණු කරන ආකෘති පත්‍රයේ මීට පෙර ඇල ඉරකින් නිල් හෝ කළු හෝ පාටින් කරන ලද සලකුණ, කතිර හැඩයක් (X) එන ලෙසට රතු පාට ඇල ඉරකින්[(/) හෝ (\)] යලිත් සලකුණු කළ යුතුයි.

40.4 40.3 නිලවරණ නියෝගයට යටත්ව නැවත ඡන්දය ගණන් කිරීමකදී 39.2 නිලවරණ නියෝගයේ සඳහන් සියලුම විධිවිධාන වලට අනුකූලව ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා කටයුතු කළ යුතුයි.

40.5 නැවත ඡන්ද ගණන් කිරීමකදී උද්ගත වන ඕනෑම කරුණක් සඳහා ඡන්දය ගණන් කිරීමේ නිලධාරියා විසින් ලබාදෙන තීරණය තීරණාත්මක විය යුතු අතර, අවසානාත්මක ද වේ.

40.6 40.1 නිලවරණ නියෝගයට අනුව නැවත ඡන්දය ගණන් කරන ලෙසට ඉල්ලා සිටීමට පෙර, එසේ නැවත ඡන්දය ගණන් කරන ලෙසට ඉල්ලා සිටින තැනැත්තා විසින් වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා නිකුත් කරන ලද තත් කාලයේ වලංගු චක්‍රලේඛනයකින් නැවත ඡන්ද ගණන් කිරීමක් සඳහා ගෙවිය යුතු බවට නියම කර ඇති මුදල මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුයි. නැවත ඡන්ද ගණන් කරන ලෙස ඉල්ලීම කරන අවස්ථාවේදීම මෙම නියෝගයේ සඳහන් මුදල ගෙවනු නොලැබුවහොත් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා විසින් නැවත ඡන්ද ගණන් කිරීමක් සිදු නොකළ යුතුයි.

## *VIII කොටස - ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම*

*නිල ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීම*

41.1 39.2 (ආ), 39.3 හෝ 40.4 හෝ නිලවරණ නියෝගයට අනුව නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනය සකස් කළ වහාම නිල ඡන්ද ප්‍රතිඵල නිවේදනය කිරීමට හා කාරක සභිකයින් ලෙස තේරී පත් වී ඇති ඡන්ද අපේක්ෂකයින්ගේ නම් ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රකටව ප්‍රදර්ශනය කිරීමට ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් කටයුතු කළ යුතුයි. එහෙත් එසේ නිල වශයෙන් ඡන්ද ප්‍රතිඵල ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කළ යුත්තේ පහත සඳහන් කර ඇති ආකාරයටයි.

(අ) නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනයට අනුව ඡන්ද ලබාගත් ඡන්ද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 10 කට වඩා වැඩි වන විට වැඩිම ඡන්ද ලබාගත් ඡන්ද අපේක්ෂකයින් 09 දෙනා කාරක සභිකයින් ලෙස තේරී පත්වී ඇති බවට ප්‍රකාශයට පත්කළ යුතුයි.

හෝ

(ආ) නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනයට අනුව ඡන්දය ලැබී ඇත්තේ ඡන්ද අපේක්ෂකයින් 05 - 09 අතර සංඛ්‍යාවකට පමණක් නම්, එම ඡන්ද අපේක්ෂකයින් කාරක සභිකයින් ලෙස තේරී පත් වී ඇති බව ප්‍රකාශයට පත්කළ යුතුයි.

හෝ

(ඇ) නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනයට අනුව ඡන්ද අපේක්ෂකයින් කිසිවෙකුටවත් කිසිදු ඡන්දයක් ලැබී නොමැති අවස්ථාවකදී හෝ ඡන්දය ලැබී ඇත්තේ ඡන්ද අපේක්ෂකයින් 05 කට වඩා අඩු සංඛ්‍යාවක් පමණක් වන අවස්ථාවකදී හෝ කිසිදු ඡන්ද අපේක්ෂකයෙක් කාරක සභිකයෙක් ලෙස තේරී පත් වී නොමැති බවට ප්‍රකාශයට පත් කළ යුතුයි.

41.2 මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරීන් විසින් නිල ඡන්ද ප්‍රතිඵල ද, ප්‍රාදේශික කාරක සභාවට කාරක සභිකයින් පත් වී ඇත්නම් එසේ පත් වූ කාරක සභිකයින්ගේ නම්, සාමාජික අංක, ලිපින හා ලබාගෙන තිබූ ඡන්ද ප්‍රමාණය ඇතුළත් ලේඛනයක් ද ප්‍රධාන ඡන්ද නිලධාරියා මගින් සමිතියේ ලේකම්වරයාට හා කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට දැනුම් දිය යුතුයි.

41.3 ප්‍රධාන ඡන්ද නිලධාරියා තමන්ට භාර දෙන ප්‍රාදේශික කාරක සභිකයින් ලෙස තේරී පත් වූ ඡන්ද අපේක්ෂකයින්ගේ නම් හා සාමාජික අංක සමිතියේ ලේකම් විසින් සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රකටව ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුයි.

41.4 41.2 නිලවරණ නියෝගයේ සඳහන් වන නිල ඡන්ද ප්‍රතිඵල ලේඛනය හා තේරී පත් වූ කාරක සභිකයින් පිළිබඳ නිවේදනය පිටපත් 02 කින් යුතුව සකස් කළ යුතුයි. එම නිවේදනය 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ජර්නලයේ ii කොටසේ සඳහන් "අ"ආකෘතියට සාරානුකූල විය යුතුයි.

## *IX* කොටස - විවිධ කරුණු

කලබල සිදුවීම් වාර්තා කිරීම

42.1 මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කාර්යයන් ඉටුකරන දිනයන්වල ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ / සහ ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය අවට පහත සඳහන් කර ඇති කාලය අතරතුර නිලවරණයට අදාළව සිදුවන සියලුම කලබලකාරී සිදුවීම් මධ්‍යස්ථානය භාර ඡන්ද නිලධාරියා / සහකාර ඡන්ද නිලධාරියා විසින් ප්‍රධාන ඡන්ද නිලධාරියා මගින් කොමසාරිස්වරයාට වාර්තා කළ යුතුයි.

(අ) නාම යෝජනා භාරගැනීම සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ගිය අවස්ථාවේ සිට ඡන්ද මධ්‍යස්ථානයෙන් පිට වූ අවස්ථාව දක්වා වූ කාලය අතරතුර සිදුවන සියලුම කලබලකාරී සිදුවීම්,

(ආ) ඡන්දය විමසීම සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ගිය අවස්ථාවේ සිට එම ඡන්ද මධ්‍යස්ථානයෙන් පිට වූ අවස්ථාව දක්වා වූ කාලය අතරතුර සිදුවන සියලුම කලබලකාරී සිදුවීම්.

42.2 42.1 (අ) නිලවරණ නියෝගයේ සඳහන් වන කලබල සිදුවීම් පිළිබඳව සකස් කරන වාර්තාව පිටපත් 02 කින් යුතුව සකස්කළ යුතුයි. එම වාර්තාව 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ජර්නලයේ i කොටසේ සඳහන් "උ" ආකෘතියට සාරානුකූල විය යුතුයි.

42.3 42.1 (ආ) නිලවරණ නියෝගයේ සඳහන් වන කලබල සිදුවීම් පිළිබඳව සකස් කරන වාර්තාව පිටපත් 02 කින් යුතුව සකස් කළ යුතුයි. එම වාර්තාව 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත්කළ තත් කාලයේ වලංගු චක්‍රලේඛනයක ජර්නලයේ ii කොටසේ සඳහන් "ආ" ආකෘතියට සාරානුකූල විය යුතුයි.

කලබල සිදු වූ විට ක්‍රියාකළ යුතු ආකාරය

43.1 නාම යෝජනා භාර ගන්නා දිනයේ දී හෝ ඡන්දය පවත්වන දිනයේදී හෝ ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ නිලවරණයට අදාළව සිදුවන සියලුම කලබල තම ඡන්ද මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරීන් මගින් පාලනය කර ගැනීමට මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා විසින් කටයුතු කළ යුතුයි.

43.2 පොලිස් නිලධාරීන් මගින් ද පාලනය කර ගත නොහැකි වන අන්දමේ කලබලකාරී වාතාවරණයක් ඇති වී ඇති අවස්ථාවක දී පළමුව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට ද, ඔහු සම්බන්ධ කර ගැනීමට නොහැකි අවස්ථාවක දි කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට ද සියලු විස්තර දැනුම් දී ඔවුන්ගෙන් ලැබෙන උපදෙස් හා නියමයන්ට අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරියා විසින් කටයුතු කළ යුතුයි.

ජර්නලය

44.1 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා විසින් මෙම නිලවරණ නියෝග මාලාවට අනුව නිලවරණ කටයුතු කිරීමේ දී මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ කාර්ය පටිපාටික සංග්‍රහය භාවිතා කළ යුතුයි.

44.2 මෙම නිලවරණ නියෝග මාලාවේ දී ජර්නලය යනුවෙන් හඳුන්වනු ලබන කොටස් 02 න් යුතු මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ කාර්ය පටිපාටික සංග්‍රහය පහත සඳහන් කර ඇති පරිදි භාවිතා කළ යුතුයි.

(i). ජර්නලයේ i කොටස - නාම යෝජනා භාර ගන්නා දිනයේ දී භාවිතා කළ යුතුයි.

(ii). ජර්නලයේ ii කොටස - ඡන්දය විමසීම සිදුකරන දිනයේ දී භාවිතා කළ යුතුයි

44.3 ජර්නලයට ඇතුළත් විය යුතු අවම කරුණු හත්වන උපලේඛනයේ සඳහන් කර ඇත. හත්වන උපලේඛනයේ සඳහන් අවම කරුණුවත් ජර්නලයට ඇතුළත් වී තිබිය යුතු අතර, 51.1 නිලවරණ නියෝගයට අදාළ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන චක්‍රලේඛනයක් මගින් මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා භාවිතා කළ යුතු ජර්නලය හඳුන්වා දිය යුතුයි.

44.4 මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් නියමයන්ට යටත්ව හත්වන උපලේඛනයේ සඳහන් වන අවම කරුණුවලට අමතරව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය පරිදි ජර්නලය සඳහා අලුතින් කරුණක් ඇතුළත් කිරීම, එසේ ඇතුළත් කරන ලද කරුණක් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ සඳහා චක්‍රලේඛනයක් නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේය.

44.5 ජර්නලය පොතක් ලෙස සකස් කළ යුතුයි. ජර්නලයේ i කොටස හා ii කොටස සඳහා වෙන වෙනම පොත් සකස් කළ යුතුයි. ජර්නලයේ ඇතුළත් වන ආකෘතිපත්‍ර වල පළමු පිටපත සුදු වර්ණයෙන් ද, දෙවන පිටපත කහ හෝ රෝස වර්ණයෙන් ද සමන්විත වී තිබිය යුතුයි.

45.1 මෙම නිලවරණ නියෝග මාලාවේ මුද්‍රණය කළයුතු බවට සඳහන් කර ඇති සියලුම දැන්වීම් හා ආකෘති පත්‍ර මුද්‍රණය කළ යුත්තේ සිංහල භාෂාවෙනි. දැන්වීම් සහ ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට භාවිතා කළ යුතු භාෂා මාධ්‍යය

45.2 එසේ වුව ද මව් භාෂාව ලෙස දෙමළ භාෂාව භාවිතා කරන සාමාජිකයින් සිටින ඡන්ද මධ්‍යස්ථාන වල සෘජුවම ඡන්ද දායකයින්ට අදාළවන සියලුම ආකෘති පත්‍ර, දැන්වීම් හා ඡන්ද පත්‍රිකා සිංහල හා දෙමළ යන භාෂා 02 න්ම මුද්‍රණය කළ යුතුයි.

46.1 මෙම නිලවරණ නියෝග මාලාවට අනුව ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමෙන් අනතුරුව කාරක සභාවල නිල කාලය අතරතුර සිදුවන කාරක සභිකයින්ගේ පුරප්පාඩු හෝ මෙම නිලවරණ නියෝග මාලාවට අනුව සිදුවන කාරක සභිකයින්ගේ පුරප්පාඩු හෝ පිරවීමට මෙම නිලවරණ නියෝග මාලාව අදාළ නොවේ. එවැනි අවස්ථාවල සිදු වන කාරක සභාවල පුරප්පාඩු පිරවිය යුත්තේ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලවයි. ප්‍රාදේශික කාරක සභාවල නිල කාලය අතරතුර සිදුවන කාරක සභිකයින්ගේ පුරප්පාඩු පිරවීමට නිලවරණ නියෝග මාලාව අදාළ නොවීම

47.1 මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් නොවන නිලවරණ කටයුතුවලට අදාළවන ඕනෑම කරුණක් පිළිබඳව ගැටලුවක් ඇති වූ අවස්ථාවක දී , යම් තැනැත්තෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන ලිඛිත නියමයන්ට අනුකූලවයි. වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන එවැනි නියමයන් තීරණාත්මක විය යුතු අතර අවසානාත්මක ද වේ. නිලවරණ නියෝග මාලාවේ සඳහන් නොවන කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය

48.1 මෙම නිලවරණ නියෝග මාලාවට අනුව ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා දැරීමට සිදුවන සියලුම වියදම් සමිතිය විසින් දැරිය යුතුයි.

48.2 අධ්‍යක්ෂක මණ්ඩලය හෝ සමිතියේ කාර්ය මණ්ඩලයේ තැනැත්තෙකු විසින් ඉටුකළ යුතු බවට මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් වන සියලුම නියමයන් ඒ ආකාරයෙන්ම ඉටුකිරීමට අදාළ තැනැත්තන් විසින් කටයුතු කළ යුතුයි. තව ද සමිතියක් විසින් ඉටුකළ යුතු යම් නියමයන්, ඉටුකළ යුත්තේ සමිතියේ කවරෙක්ද යන්න මෙම නිලවරණ නියෝග මාලාවේ නිශ්චිතවම සඳහන් නොවන විට, එවැනි සියලු නියමයන් ඉටුකිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලයට පැවරේ.

48.3 8.3 නිලවරණ නියෝගයේ සඳහන් කරුණුවලට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය , සමිතියේ නිලධාරියෙකු / සේවකයෙකු විසින් ඉටුකළ යුතු බවට මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් වන යම් නියමයක් / නියමයන් ඉටුනොකරන විට නොපමාවම ඒ බව සමිතිය භාරව සිටින සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීවරයා හෝ ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් ලිඛිතව කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට සහ වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දිය යුතුයි. එවිට නිලවරණ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය / නිලධාරීන් / සේවකයින් විසින් පැහැර හරින ලද කාර්යන් ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ උපදෙස් මත කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් ගත යුතුයි. 8.3 (ඇ) නිලවරණ නියෝගයට යටත්ව එසේ පැහැර හරින ලද නිලවරණ කාර්යයන් ඉටුකිරීමට මෙම නිලවරණ නියෝග මාලාවෙන් නියම කර ඇති අවසාන දිනයේ සිට උපරිම වශයෙන් දින 14 ක් ඇතුළත තම නිලධාරීන් මගින් අදාළ නිලවරණ කාර්යයන් ඉටුකිරීම ආරම්භ කිරීමට කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා කටයුතු කළ යුතුයි. සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය විසින් නිලවරණ නියෝග මාලාවෙන් නියම කර ඇති කාර්යයන් ඉටු නොකරන විට ක්‍රියාකළයුතු ආකාරය

(අ). එසේ වුවද මෙම නිලවරණ නියෝගයේ සඳහන් වන පරිදි දින 14 ක් ඇතුළත පැහැර හරින ලද නිලවරණ කාර්යයන් ඉටු කිරීම ආරම්භ කළහොත් මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කර ඇති නිලවරණ කාර්යයන් නියමිත දිනවලදී සිදු කිරීමට නොහැකි වන බව පෙනී යන්නේ නම්, අදාළ නිලවරණ කාර්යය දින 14 කට අඩු කාලයකින් ආරම්භ කර වීමට අවශ්‍ය පියවර කොට්ඨාසය භාර සහකාර කොමසාරිස්වරයා විසින් ගත යුතුයි.

48.4 8.3 හෝ / සහ 48.3 යන නිලවරණ නියෝගවලට අනුව කටයුතු කිරීම නිසා වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන සියලුම වියදම් ගෙවීමට සමිතිය බැඳී සිටියි. සමිතිය විසින් එවැනි ගෙවීම් පැහැර හරින්නේනම්, වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම සමිතියට ගෙවිය යුතු ඕනෑම මුදලකින් එකී වියදම් ඕනෑම කාලයක දී හිලවු කර ගැනීමට කොමසාරිස්වරයාට බලය ඇත.

නිලවරණ කටයුතු භාර නිලධාරියාගේ, ඡන්ද විමසීම භාර නිලධාරියාගේ, ඡන්ද ගණන් කිරීමේ නිලධාරියාගේ රාජකාරි ඉටුකළ යුතු නිලධාරීන්

49.1 නාම යෝජනා භාර ගන්නා දිනයේදී නිලවරණ කටයුතු භාර නිලධාරියා ලෙසද, ඡන්දය විමසන දිනයේ දී, ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට ඡන්ද විමසීම භාර නිලධාරියා ලෙස ද, ඡන්ද ගණන් කිරීම හා ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් වූ විට ඡන්ද ගණන් කිරීමේ නිලධාරියා ලෙස ද, කටයුතු කළ යුත්තේ ඒ ඒ දිනවලදී ඡන්ද මධ්‍යස්ථානය භාරව කටයුතු කරන මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියායි.

49.2 මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාගේ රාජකාරී හා තනතුරු නාම ද ඉහත සඳහන් කර ඇති අන්දමට වෙනස් වන විට, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයේ රාජකාරී හා තනතුරු නාම ද ඒ අනුව වෙනස් විය යුතුයි.

නිලවරණ නියෝගයක් සංශෝධනය කිරීම

50.1 මෙම නිලවරණ නියෝග මාලාවට අලුතින් නිලවරණ නියෝගයක් / උපලේඛනයක් / ආකෘති පත්‍රයක් එකතු කිරීම හෝ යම් වලංගු නිලවරණ නියෝගයක් / උපලේඛනයක් / උපලේඛනයක සඳහන් කර ඇති ආකෘති පත්‍රයක් සංශෝධනය කිරීම , පරිච්චින්න කිරීම හෝ නිලවරණ නියෝගයක් සංශෝධනය කිරීමකට ඇතුළත් වේ.

50.2 වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පමණක් නිලවරණ නියෝගයක් සංශෝධනය කළ යුතුයි.

කොමසාරිස්වරයාට චක්‍රලේඛන මගින් උපදෙස් හා නියමයන් නිකුත් කිරීමේ බලය ඇතිවන අවස්ථා

51.1 පහත සඳහන් කර ඇති තැනැත්තන්ට මෙම නිලවරණ නියෝග මාලාවෙන් පැවරී ඇති කාර්යයන් වඩාත් විධිමත්ව හා විනිවිදව ඉටු කිරීම සහතික කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, අතුරු විධිවිධාන හා ඊට අදාළ අනුෂාංගික කරුණු පිළිබඳව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් චක්‍රලේඛන මගින් උපදෙස්, නියමයන්, 44.2 හා 44.3 යන නිලවරණ නියෝග වලට යටත්ව උපලේඛනයකට අදාළ නොවන ආකෘති පත්‍ර හා පිරික්සුම් ලැයිස්තු ලබාදීම නීත්‍යානුකූල වන්නේය.

(අ). කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට, ප්‍රධාන ඡන්ද නිලධාරියාට, මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන්ට, ඡන්ද නිලධාරීන්ට සහ සහකාර ඡන්ද නිලධාරීන්ට
(ආ). අධ්‍යක්ෂ මණ්ඩලයට, සාමාන්‍යාධිකාරීවරයාට හා ලේකම්වරයාට

51.2 එසේ වුවද 51.1 නිලවරණ නියෝගයේ සඳහන් අන්දමට නිකුත් කරන චක්‍රලේඛනයක සඳහන් විධිවිධානයක් , මෙම නිලවරණ නියෝග මාලාවේ නිලවරණ නියෝගයක සඳහන් විධිවිධානයකට කිසිඳු විටක අනනුකූල නොවිය යුතුයි.

51.3 51.1 නිලවරණ නියෝගයට අනුව නිකුත් කරන චක්‍රලේඛනයක සඳහන් කවර හෝ උපදෙසක්, නියමයක්, ආකෘති පත්‍රයක් හෝ පිරික්සුම් ලැයිස්තුවක් මෙම නිලවරණ නියෝග මාලාවේ නිලවරණ නියෝගයක සංශෝධනයක් ලෙස සැලකිය යුතු නොවේ.

51.4 එසේ වුවද 51.1 නිලවරණ නියෝගයට අනුකූලව නිකුත් කරන චක්‍රලේඛනයක සඳහන් වන විධිවිධාන හා ආකෘතිපත්‍ර, මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් වන නිලවරණ නියෝගයක් සේම වලංගුව හා බලසහිතව නිලවරණ කටයුතු සඳහා බලාත්මක වන බව සැලකිය යුතුයි.

52.1 තත් කාලයේ වලංගු සමුපකාර සමිති පනතක / ප්‍රඥප්තියක, සමුපකාර සමිති රීති මාලාවක හෝ ඒවායේ සංශෝධනයක හෝ සඳහන් යම් විධිවිධානයක් සමග මෙම නිලවරණ නියෝග මාලාවේ ඇතුළත් යම් නිලවරණ නියෝගයක සඳහන් විධිවිධානයකට පටහැනි වන ඕනෑම අවස්ථාවක දී, එම නිලවරණ නියෝගයේ සඳහන් විධිවිධාන අභිබවා තත් කාලයේ වලංගු, සමුපකාර සමිති පනතේ / ප්‍රඥප්තියේ, සමුපකාර සමිති රීති මාලාවේ හෝ ඒවායේ සංශෝධනයන් වල හෝ විධිවිධාන බලාත්මක විය යුතුයි.

නිලවරණ නියෝග මාලාවේ සඳහන් නියෝග අභිබවා ඇතැම් නිතී බලාත්මක වන අවස්ථා

53.1 ප්‍රධාන ඡන්ද නිලධාරියා / මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන් / ඡන්ද නිලධාරීන් / සහකාර ඡන්ද නිලධාරීන් විසින් සමිතියේ ලේකම් වෙත භාරදෙන සමිතියේ නිලවරණ කටයුතු වලට අදාළ ඕනෑම ලේඛනයක් / ආකෘති පත්‍රයක් නිලවරණය පිළිබඳව යම් නීති කෘත්‍යයක් ආරම්භ වී නැත්නම් හෝ පැමිණිල්ලක් ලැබී නැත්නම් හෝ නිලවරණ කටයුතු අවසාන වූ දිනයේ සිට අවම වශයෙන් අවුරුදු 01 ක් වත් සුරක්ෂිතව තමා භාරයේ තබා ගැනීමේ වගකීම සමිතියේ ලේකම් වෙත පැවරේ. එසේ වුවද නිලවරණය පිළිබඳව යම් නීති කෘත්‍යයක් ආරම්භ වී ඇති අවස්ථාවක හෝ පැමිණිල්ලක් ලැබී ඇති අවස්ථාවක හෝ ඒ නීති කෘත්‍යය / පැමිණිල්ල පිළිබඳව කටයුතු කර අවසාන වී මාස 06 ක් වත් ගතවන තුරු නිලවරණයට අදාළ සියළුම ලේඛන / ආකෘති පත්‍ර සුරක්ෂිතව තබා ගැනීමේ වගකීම ද සමිතියේ ලේකම්වරයාට පැවරේ.

නිලවරණයට අදාළ ලියකියවිලි ආරක්ෂා සහිතව තබා ගැනීමේ කාලය හා එහි වගකීම

53.2 ප්‍රධාන ඡන්ද නිලධාරියා / මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරීන් / ඡන්ද නිලධාරීන් / සහකාර ඡන්ද නිලධාරීන් විසින් කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත භාරදෙන සමිතියේ නිලවරණ කටයුතු වලට අදාළ ඕනෑම ලේඛනයක් / ආකෘති පත්‍රයක් නිලවරණය පිළිබඳව යම් නීති කෘත්‍යයක් ආරම්භ වී නැත්නම් හෝ පැමිණිල්ලක් ලැබී නැත්නම් හෝ නිලවරණ කටයුතු අවසාන වූ දිනයේ සිට අවම වශයෙන් මාස 06 ක් වත් සුරක්ෂිතව තමා භාරයේ තබා ගැනීමේ වගකීම සමිතියේ කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා වෙත පැවරේ. එසේ වුවද නිලවරණය පිළිබඳව යම් නීති කෘත්‍යයක් ආරම්භ වී ඇති අවස්ථාවක හෝ පැමිණිල්ලක් ලැබී ඇති අවස්ථාවක හෝ ඒ නීති කෘත්‍යය / පැමිණිල්ල පිළිබඳව කටයුතු කර අවසාන වී මාස 06 ක් වත් ගතවන තුරු නිලවරණයට අදාළ සියළුම ලේඛන / ආකෘති පත්‍ර සුරක්ෂිතව තබා ගැනීමේ වගකීම ද කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට පැවරේ.

54.1 මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කර ඇති නිලවරණ කාර්යයන් විධිමත්ව ඉටු කිරීම සඳහා, එම නිලවරණ කාර්යන් ඉටුකළ යුතු කාල සීමාවන් හා ඒවා ඉටු කිරීමට වගකිව යුතු තැනැත්තන් පැහැදිලිව හඳුනාගැනීමට 8 වන උපලේඛනයේ සඳහන් පිරික්සුම් ලැයිස්තු භාවිතා කළ යුතුයි.

නිලවරණ කාර්යයන් සඳහා පිරික්සුම් ලැයිස්තු භාවිතා කිරීම

(අ). මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් යම් නිලවරණ කාර්යයක් ඉටු කළයුතු බවට නියම කර ඇති කාල සීමාවත්, එම නිලවරණ කාර්යයටම අදාළව 8 වන උපලේඛනයේ පිරික්සුම් ලැයිස්තුවල සඳහන් කර ඇති කාල සීමාවත් අතර යම් වෙනසක් ඇති බව පෙනී යන අවස්ථාවක දී පමණක්, මෙම නිලවරණ නියෝග මාලාවේ වෙනත් ස්ථානයක එම නිලවරණ කාර්යයට අදාළ කාල සීමාවන් පිළිබඳව කුමක් සඳහන් වී තිබුනත් එම සියලු නියමයන් අභිබවා 8 වන උපලේඛනයේ පිරික්සුම් ලැයිස්තුවල සඳහන් කර ඇති ඊට අනුරූපී කාල සීමාවන් නිවැරදි හා වලංගු ලෙස සලකා ඒ අනුව නිලවරණ කාර්යයන් ඉටු කිරීම නීත්‍යානුකුල වේ.

(ආ). 8 වන උපලේඛනයේ සඳහන් කර ඇති යම් නිලවරණ කාර්යයක් ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණය කළ යුතු බවට එම උපලේඛනයෙන් නියම කර ඇති තැනැත්තන් විසින් එසේ නියම කර ඇති පරිදි අධීක්ෂණ කටයුතු කිරීම ද, මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කර ඇති යම් නිලවරණ කාර්යයක් ඉටු කිරීම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය /සභාපතිවරයා / අධ්‍යක්ෂවරයෙක් /සාමාන්‍යාධිකාරීවරයා / ලේකම්වරයා පැහැර හරින බව පෙනී යන අවස්ථාවක දී ඒ පිළිබඳව නොපමාවම ඊට වගකිව යුතු තැනැත්තන් මගින් අදාළ නිලවරණ කාර්යය ඉටු කර ගැනීමට අවශ්‍ය වන විධිවිධාන සැලැස්වීම ද, එසේ කිරීමෙන් පසුව ද අදාළ තැනැත්තා /තැනැත්තන් විසින් නිලවරණ කාර්යන් ඉටු කිරීම පැහැර හරින බව පෙනී යන්නේනම් නොපමාවම ඒ පිළිබඳව වයඹ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාව සහ කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාව දැනුවත් කිරීම ද, නීත්‍යානුකූල වන අතර එය අදාළ අධීක්ෂණ නිලධාරියාගේ වගකීම ද වේ.

අන්තර්කාලීන විධිවිධාන

55.1 මෙම නිලවරණ නියෝග මාලාව ගැසට් පත්‍රයේ පලකළ වර්ෂයේ දී නිලවරණ නියෝග මාලාවේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඒ පිළිබඳව අවශ්‍ය වන්නා වූ පරිපාලනමය වෙනස්කම් කිරීම සඳහා හෝ පුවත්පත් දැන්වීමක් මගින් පල කරන ලද නියමයක් මගින් වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් නිශ්චිත කාල සීමාවක් සඳහා මෙම නිලවරණ නියෝග මාලාවේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද, කළයුතු බව අවශ්‍ය යයි ඔහුට පෙනී යන්නා වූ ද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් විධානයක් කිරීම හෝ නීත්‍යානුකූල වන්නේය.

55.2 56.1 නිලවරණ නියෝගයෙන් පරිච්ඡින්න කරන ලද නිලවරණ නියෝග මාලාවක නම, ඊට අදාළ ගැසට් අංකය හා දිනය ද නිශ්චිතව සඳහන් කරමින්, එම නියෝගවලට අනුව ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගත යුතු බවට සඳහන් නියමයක් යම් සමිතියක අතුරු ව්‍යවස්ථාවක ඇතුළත් වී ඇත්නම්, එවැනි සමිතියක නිලවරණ කටයුතු සඳහා පමණක් ඊට අදාළ පරිච්ඡින්න කරන ලද නිලවරණ නියෝග මාලාව තවදුරටත් වලංගු සහ බලසහිත විය යුතුයි.

(අ). එසේ වුවද පරිච්ඡින්න කරන ලද නිලවරණ නියෝග මාලාවක්, 55.2 නිලවරණ නියෝගයේ සඳහන් වන පරිදි යම් සමිතියක් සඳහා වලංගු වීම බලාත්මක වන්නේ මෙම නිලවරණ නියෝග මාලාව වයඹ පළාත සඳහා බලාත්මක වූ දිනයේ සිට උපරිම වශයෙන් ඉදිරි අවුරුද්දක කාල සීමාවක් සඳහා පමණි.

55.3 මෙම නිලවරණ නියෝග මාලාව වයඹ පළාත සඳහා බලාත්මක වන දිනය වන විට 56.1 නිලවරණ නියෝගයෙන් පරිච්ඡින්න කළ නිලවරණ නියෝග මාලාවට අනුව සිදුකර ඇති යම් නිලවරණ කාර්යයක්, මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් වන යම් නිලවරණ කාර්යයක් සමග ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයක් ඇති වූ විට ඒ දුෂ්කරතාවය ඉවත් කිරීම සඳහා වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් 51.1 නිලවරණ නියෝගයට අනුව කටයුතු කිරීම නීත්‍යානුකූල වේ.

55.4 5.1 (ඇ) යන නිලවරණ නියෝගවල කුමක් සඳහන් වුවත්, එම නිලවරණ නියෝගවල සඳහන් වන නියමයන් ඉටු කිරීමෙහිලා යම් ප්‍රායෝගික දුෂ්කරතාවයක් තිබෙන බව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට පෙනී යන විට, ඔහු විසින් මෙම නිලවරණ නියෝග මාලාව වයඹ පළාත සඳහා බලාත්මක වූ දිනයේ සිට ඉදිරියට උපරිම වශයෙන් අවුරුදු 02 ක කාලයක් සඳහා එම නිලවරණ නියෝග වල සඳහන් නියමයන් යම් සමිතියක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේය.

පැරණි ඡන්ද නියෝග පරිච්ඡින්න කිරීම

56.1 1977.12.28 දිනැති අංක 297/7 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විවිධ සේවා සමුපකාර සමිතියක සහ කොළඹ උතුර සහ කොළඹ දකුණ සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභාවක් පත්කර ගැනීමේ නියෝග ද, එකී නියෝග සංශෝධනය කරමින් 1992.03.27 දිනැතිඅංක 707/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියෝග ද, 2015.03.19 දිනැති අංක 1906/44 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ (පළාත් සභා) පළ කරන ලද වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීමේ නියෝග ද මෙම නිලවරණ නියෝග මාලාව ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. ඒ අයුරින් පරිච්ඡින්න කරන ලද නියෝග මෙම නිලවරණ නියෝග මාලාවේ දී පරිච්ඡින්න කරන ලද නිලවරණ නියෝග මාලාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

56.2 එසේ වුවද මෙම නිලවරණ නියෝග මාලාව වයඹ පළාතට බලාත්මක වන දිනට නිලවරණ කටයුතු සම්බන්ධයෙන් වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා හෝ අධිකරණය හෝ ඉදිරියේ ඇති සියලුම කරුණු, ප්‍රකාශ, ලියවිලි, සහතික කළ පිටපතක හා නීති කෘත්‍යාන්වලට අදාළව ඉහත 56.1 නිලවරණ නියෝගයේ සඳහන් කර ඇති පරිච්ඡින්න කරන ලද නිලවරණ නියෝග මාලාවක් යටතේ උද්ගත වූ හෝ/ සහ තීරණය කරනු ලැබූ කරුණුවලට කිසිඳු අගතියක් නොවන පරිදි, එකී කරුණු සඳහා පමනක් ඉහතකී පරිච්ඡින්න කරන ලද අදාළ නිලවරණ නියෝග මාලාවේ සඳහන් විධිවිධාන හා උපලේඛන තවදුරටත් එලෙසම වලංගුව ද, බල සහිතව ද පවතින සේ ආවේශ්‍ය කර ගනු ලැබිය යුතුයි.

57.1 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නිලවරණ නියෝග මාලාවේ ; අර්ථ නිරූපනය

(i). සමිතිය යන්නෙන් ; වලංගු සමුපකාර නීතියක් යටතේ ලියාපදිංචි කර ඇති නිලවරණයට අදාළ විවිධ සේවා සමුපකාර සමිතියක් අදහස් වේ.

(ii). සාමාජිකයා, ප්‍රාදේශිකය, ප්‍රාදේශික කාරක සභිකයා, ප්‍රාදේශික කාරක සභාව, ප්‍රාදේශික බල ප්‍රදේශය, මහ සභාව, සභාපති, උපසභාපති, අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ මණ්ඩලය, සමාන්‍යාධිකාරී, ලේකම් සහ සමිතියේ බල ප්‍රදේශය යන්නට ; සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ එකී වචන සඳහා ලබා දී අර්ථයම අදහස් වේ.

(iii). සමිතියේ නිලධාරින්, සේවකයින් හා කාර්ය මණ්ඩලය යන්නට ; තත් කාලයේ වලංගු වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමිතියේ සේවකයින් අදහස් වේ.

(iv). කොමසාරිස්වරයා යන්නෙන් ;තත් කාලයේ වලංගු සමුපකාර නීතියේ අර්ථානුකූල වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා, සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයා, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු අදහස් වේ.

(v). කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා යන්නෙන් ;සමිතියේ අධීක්ෂණ කටයුතු වල වගකීම පැවරී ඇති වයඹ පළාතේ ස්ථාපිත කර ඇති සහකාර සමුපකාර කොමසාරිස් කාර්යාලයක් භාරව සිටින සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා අදහස් වේ.

(vi). සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරියා යන්නෙන් ; සමිතියේ අධීක්ෂණ කටයුතු භාරව කටයුතු කිරීමට කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් පත්කර ඇති වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදහස් වේ.

(vii). ප්‍රධාන ඡන්ද නිලධාරියා යන්නෙන් ;නිලවරණ නියෝග මාලාවේ සඳහන් වන අන්දමට සමිතියේ ප්‍රධාන ඡන්ද නිලධාරියාගේ කාර්යයන් කළ යුතු හා එම කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම දරණ වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදහස් වේ.

(viii). මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියා යන්නෙන් ; සමිතියේ යම් ඡන්ද මධ්‍යස්ථානයක නිලවරණ කටයුතු භාරව සිටින හා එම කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම දරණ වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදහස් වේ.

(ix). ඡන්ද නිලධාරියා හා සහකාර ඡන්ද නිලධාරියා යන්නෙන් ; සමිතියේ ප්‍රධාන ඡන්ද නිලධාරියාට හෝ / සහ මධ්‍යස්ථාන භාර ඡන්ද නිලධාරියාට නිලවරණ කටයුතුවලදී සහාය වීම සඳහා කොට්ඨාශ භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයා විසින් පත්කර ඇති වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදහස් වේ.

(x). පුරුෂ වාචක පදවලට අවස්ථාවෝචිතව ස්ත්‍රී වාචක පදද ඇතුළත් වන බව අදහස් වේ.

(xi). ඒකවචන පද වලට අවස්ථාවෝචිතව බහුවචනාර්ථය ද ඇතුළත්වන බව හා, එය ප්‍රතිලෝම වශයෙන්ද ක්‍රියාත්මක වන බව අදහස් වේ.

(xii). නිලවරණ කටයුතු යන්නෙන් ; සමිතියේ ඒ ඒ ප්‍රාදේශිකවල ඡන්ද නාම ලේඛන සකස් කිරීමට නියම කර ඇති දිනයේ සිට සියලුම ප්‍රාදේශික කාරක සභිකයින් පත් වූ බව හෝ පත් නොවූ බව හෝ සඳහන් නිල ඡන්ද ප්‍රතිඵල මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් කර ඇති අදාල නිලධාරින් විසින් කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස්වරයාට හා සමිතියේ ලේකම්වරයාට දන්වන අවස්ථාව දක්වා අතර කාලය තුළ සිදු කරන / සිදු කළ යුතු නිලවරණයට අදාල සියලු නිල ක්‍රියාවන් අදහස් කෙරේ.

(xiii). නිලවරණ නියෝගයක් යන්නෙන් ;නිලවරණ නියෝග මාලාවේ සඳහන් වගන්තියක්, ඊට අදාළ උප වගන්තියක් , ඡේදයක් සහ උපලේඛනයක් අදහස් කෙරේ.

(xiv). නිලවරණ නියෝග මාලාව යන්නෙන් ;නිලවරණ නියෝග, උපලේඛන හා උපලේඛනවල ඇතුළත් ආකෘති පත්‍ර යන සියල්ලේම සංයුක්ත වීමක් අදහස් වේ.

(xv). තත් කාලයේ වලංගු සමුපකාර නීතිය යන්නෙන් ; තත් කාලයේ වයඹ පළාතට වලංගු සමුපකාර සමිති පනතක් / ප්‍රඥප්තියක් , සමුපකාර සමිති රීති මාලාවක් හෝ ඒ වෙනුවට පනවන ලද යම් නීතියක් අදහස් වේ.

(xvi) මුද්‍රණය කිරීමක් යන්නට, රෝනියෝ යන්ත්‍රයකින් හැර වෙනත් ඕනෑම මුද්‍රණ යන්ත්‍රයකින් සිදු කරන මුද්‍රණයක් අදහස් වේ;

(xvii) ඡන්දදායකයා යන්නෙන්, 8.2 නිලවරණ නියෝගයේ සඳහන් වන ඡන්ද නාමලේඛනයේ ඡන්ද දායකයෙකු ලෙස නම ඇතුළත් වී ඇති ඕනෑම සාමාජිකයෙකු අදහස් වේ;

(xviii) ඡන්ද මධ්‍යස්ථානය යන්නෙන්, නාම යෝජනා හා විරෝධතා භාර ගන්නා ස්ථානයක් මෙන්ම ඡන්දදායකයෙක් තම ඡන්දය පාවිච්චි කරන, ඡන්දදායකයන්ගේ ඡන්ද ගණන් කරන හා ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන ස්ථානයක් ද අදහස් වේ;

(xix) ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රය යන්නෙන් ඡන්ද මධ්‍යස්ථානය පිහිටුවා ඇති ගොඩනැගිල්ල , භූමිය හා එම භූමියේ ඇති වෙනත් ගොඩනැගිලි ද අදහස් වේ.

(xx) *ගැසට් පත්‍රය* යන්නෙන්, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* (පළාත් සභා) අදහස් වේ.

57.2 මෙම නිලවරණ නියෝග මාලාවේ සඳහන් ඕනම නිලවරණ නියෝගයක් හෝ නිලවරණ නියෝගයක සංයුක්ත වී ඇති වචනයක් හෝ අකුරක් හෝ ඉලක්කමක් හෝ සංකේතයක් හෝ පිළිබඳව අර්ථ නිරූපනය කිරීමේ බලය ඇත්තේ වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට පමණක් වන අතර, ඔහු විසින් කරන එවැනි අර්ථ නිරූපනයක් තීරණාත්මක විය යුතු අතර අවසානාත්මක ද වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වේ.

58.1 මෙම නිලවරණ නියෝග මාලාවේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවක දී සිංහල භාෂා පාඨය අනුකූල විය යුතුයි.

**උපලේඛන ලැයිස්තුව**

| *උපලේඛනය* | *උපලේඛනයේ නම* | *කොටස* | *නිලවරණ නියෝගය* |
|---|---|---|---|
| 1 වෙනි උපලේඛනය | ඡන්දය හිමි සාමාජික නාම ලේඛන කොට්ඨාසය භාර සහකාර සමුපකාර කොමසාරිස් වෙත භාරදීමේදී සමිතිය විසින් ලබා දිය යුතු සහතිකය | ii | 8.1 (ඉ) |
| 2 වෙනි උපලේඛනය "අ" ආකෘතිය | සහකාර සමුපකාර කොමසාරිස් විසින් ඡන්ද නිලධාරීන්ට නිකුත් කළ යුතු පත්වීම් ලිපි | iii | 10.1 (ඇ) |
| 3 වෙනි උපලේඛනය "අ" ආකෘතිය | ප්‍රධාන ඡන්ද නිලධාරියා විසින් සමිතියේ කාර්ය මණ්ඩලයට නිකුත් කළ යුතු පත්වීම් ලිපි | iii | 12.6 |
| 4 වෙනි උපලේඛනය "අ" ආකෘතිය | නාම යෝජනා පත්‍රය | iv | 15.4 |
| 5 වෙනි උපලේඛනය "අ" ආකෘතිය | ඡන්ද පත්‍රිකාව | vi | 26.1 |
| 6 වෙනි උපලේඛනය "අ" ආකෘතිය | ඡන්ද පත්‍රිකා ගිණුම | vi | 34.2 |
| 7 වෙනි උපලේඛනය | ජර්නලයක ඇතුළත් විය යුතු අවම කරුණු | ix | 44.3 |
| 8 වෙනි උපලේඛනය | පිරික්සුම් ලැයිස්තු (අ, ආ, ඇ, ඈ ) | ix | 54.1 |

1 වෙනි උපලේඛනය - **[II** - 8.1 (ඉ)**]**

ඡන්දය හිමි සාමාජික නාම ලේඛන කොට්ඨාස භාර සහකාර සමුපකාර කොමසාරිස් වෙත භාර දීමේදී සමිතිය විසින් ලබා දිය යුතු සහතිකයක ආදර්ශය

.............................. සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී මගින්,
.................................................. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත,

සී/ස ................................................................ විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රාදේශිකවල ඡන්දය හිමි සාමාජික නාමලේඛන සහතික කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

20................. දිනැති අංක ..................... දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ (පළාත් සභා) පල කරන ලද වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයින් තෝරා පත්කර ගැනීමේ සමුපකාර නිලවරණ නියෝග මාලාවේ 8.1 (අ) / 8.1 (ආ) * හා 8.1 (ඇ) යන නිලවරණ නියෝගවලට අනුව සකස් කල සී/ස .............................................. විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් කර ඇති ප්‍රාදේශිකවල පිටපත් 03 කින් යුතු ඡන්දය හිමි සාමාජික නාම ලේඛන ...........ක්, 8.1 (ඇ) නිලවරණ නියෝගයට අනුව සහතික කර ගැනීම සඳහා ඔබ වෙත මේ සමග ඉදිරිපත් කරමු.

02. ඉදිරිපත් කර ඇති ඡන්දය හිමි සාමාජික නාමලේඛන පිළිබඳ විස්තර :

| අනු. අංකය | ප්‍රාදේශිකයේ නම | ප්‍රාදේශික අංක | ඡන්දය හිමි සාමාජික නාම ලේඛනයේ සඳහන් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සාමාජික නම් ගණන | අනු. අංකය | | සාමාජික අංක | | පිටු අංක | |
| | | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

03. වර්තමානයේ බලාත්මක සමුපකාර නීතියේ, ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ හා නිලවරණ නියෝග මාලාවේ සඳහන් නියමයන්ට අනුව ඉහත සඳහන් කර ඇති ඡන්දය හිමි සාමාජික නාමලේඛනවලට;

(අ) ඇතුළත් කිරීමට සුදුසුකම් ඇති සියලුම සාමාජිකයින්ගේ නම් හා සාමාජික අංක ඇතුළත් කර ඇති බව ද,
(ආ) සාමාජික ඉල්ලුම් පත්වල සඳහන් වන අන්දමට සාමාජිකයින්ගේ නම් හා සාමාජික අංක නිවැරදිව ඇතුළත් ඇති බව ද,
(ඇ) ඇතුළත් කිරීමට නීත්‍යානුකූල සුදුසුකම් ඇති කිසිදු සාමාජිකයෙකුගේ නමක් ඇතුළත් කිරීම මග හැරී නොමැති බව ද,
(ඈ) ඇතුළත් කිරීමට සුදුසුකම් නැති කිසිදු සාමාජිකයෙකුගේ නමක් ඇතුලත් කර නොමැති බව ද,
(ඉ) කිසිදු ව්‍යාජ නමක් ඇතුළත් කර නොමැති බවද,
(ඊ) කිසිදු ව්‍යාජ තොරතුරක් ඇතුළත් කර නොමැති බවද,

අපි සහතික කර ප්‍රකාශ කර සිටිමු.

| | | | |
|---|---|---|---|
| ......................... | ......................... | ......................... | ......................... |
| ලේකම් | සාමාන්‍යාධිකාරී | සභාපති/ උප සභාපති | අධ්‍යක්ෂක |
| 20................. | 20................. | 20................. | 20................. |

**2 වෙනි උපලේඛනය - (III - 10.1)**

